# වාර්ෂික වාර්තාව
# 2014

ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම

# ප්‍රගති වාර්තාව
# 2014

ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම

# ප්‍රගති වාර්තාව - 2014

## 1.0 හැඳින්වීම

1985 අංක 28 දරණ පාර්ලිමේන්තු පනත මගින් දූයේ දරුවනට ගුණාත්මක අධ්‍යාපනයක් උරුම කර දීම සඳහා ඉවහල් වන පහත සඳහන් අරමුණු ඉටුකරලීමේ බලය ජාතික අධ්‍යාපන ආයතනයට පවරා ඇත.

(අ) ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය සංවර්ධනය කිරීම සඳහා වූ සැලසුම්, වැඩ සටහන් සහ ක්‍රියාකාරකම් පිළිබඳව විෂයභාර අමාත්‍යවරයාට උපදෙස් දීම;

(ආ) අධ්‍යාපනය හා අදාළ විශේෂිත ක්ෂේත්‍ර සඳහා පශ්චාත් උපාධි අධ්‍යාපනය සැලසීම හා ඒවා ප්‍රවර්ධනය කිරීම.

(ඇ) අධ්‍යාපන පද්ධතියෙහි කාර්ය සාධනය, අරමුණු, ව්‍යුහ, අන්තර්ගතය සහ විධි ක්‍රම ද ඇතුළුව අධ්‍යාපන ක්‍රමය පිළිබඳව සහ අධ්‍යාපනයේ සමාජ, ආර්ථික සහ වෙනත් අංශ අනාවරණය කර ගැනීම සඳහා අධ්‍යයන පවත්වාගෙන යාම සහ ප්‍රවර්ධනය කිරීම;

(ඈ) අධ්‍යාපනික කාර්ය සඳහා තාක්ෂණික ඥානය අනුවර්තනය කිරීම ද ඇතුළුව අධ්‍යාපන පද්ධතියේ නවීකරණ ක්‍රියාවලි ආරම්භ කිරීම සහ ප්‍රවර්ධනය කිරීම;

(ඉ) අධ්‍යාපන පද්ධතියෙහි නියැළි කාර්ය මණ්ඩලවල වෘත්තීය සහ කළමනාකරණ නිපුණතා වැඩි දියුණු කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම;

(ඊ) රජයට සහ වෙනත් අනුමත සංවිධාන සඳහා අධ්‍යාපනය හා සම්බන්ධ විශේෂඥ සේවා ලබාදීම;

(උ) විෂයභාර අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද වෙනත් අධ්‍යාපන සංවර්ධනය වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම සහ

(ඌ) සමාන අරමුණු ඇති වෙනත් ආයතන සමග සහයෝගීව කටයුතු කිරීම.

ඒ අනුව දේශීය හා ගෝලීය අවශ්‍යතාවලට සරිලන, සමාජ ආර්ථික සංදර්භයට උචිත, චිර භාවිත දේශිය දූනුම් හා උරුමයන් අගයන ඵලදායී පුරවැසියන් බිහි කිරීම සඳහා ඉවහල් වන විෂයමාලාවක් මගින් අධ්‍යාපනයේ ගුණාත්මක බව සහතික කිරීමේ ද, පාසල් පද්ධතියට අවශ්‍ය නිපුණතා පූර්ණ වෘත්තිකයන් පිරිසක් නිර්මාණය කරනු සඳහා නායකත්වය සැපයීමේ ද, අධ්‍යාපන සංවර්ධනය ඉලක්ක කර ගත් ප්‍රතිපත්ති සම්පාදනය සුසාධ්‍ය කිරීමට හා ඊට මග පෙන්වනු පිණිස විද්‍යාත්මක විධි ක්‍රම ඔස්සේ තහවුරු කරගත් තොරතුරු පද්ධතියක් ස්ථාපිත කිරීමේ ද වගකීම ජාතික අධ්‍යාපන ආයතනයට පැවරී ඇත.

කාලයේ වේගය ඉක්මවා විවිධ ඉගෙනුම් ක්ෂේත්‍ර තුළට එකතුවන නව දූනුම ජාතියේ දරුවනට උරුම කර දීම සඳහා ශ්‍රී ලංකාවේ දූනට ක්‍රියාත්මක විෂයමාලා ප්‍රතිපත්තියට අනුව සෑම අවුරුදු 8කට වරක් ම විෂයමාලා නවීකරණ ක්‍රියාවලියක් සිදු කෙරේ. ඒ අනුව පසුගිය විෂයමාලා සංවර්ධන ක්‍රියාවලිය 2005 වර්ෂයෙන් ආරම්භ වී 2010 වසරේ දී සාර්ථකව නිම කරන ලදී. පාසල් විෂයමාලාව අරභයා 2012 වසරේ දී තබන ලද ස්ථාවර පදනම මත පිහිටා 2015 වසරේ සිට ක්‍රියාත්මක කිරීමට යෝජිත නව විෂයමාලාව සඳහා පවත්නා විෂයමාලාව විචාරවත් විෂයමාලාවක් බවට පත් කිරීමේ කටයුතු 2013

වසරේ දී ආරම්භ කරන ලදි. ඒ අනුව 2014 වසරේ අවධානය මූලික වශයෙන් ම නාභිගත කරන ලද්දේ 7 සහ 11 ශ්‍රේණි සඳහා ගුරු අත්පොත් සකස් කිරීමට සහ 8 ශ්‍රේණිය සඳහා විෂය නිර්දේශ සකස් කිරීම සඳහාත් ය. අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩසටහන හඳුන්වා දීමෙන් අනතුරුව විෂයමාලා සංවර්ධනය හා සම්බන්ධ කටයුතු සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ප්‍රධාන වශයෙන් ආවරණය කර ගන්නා ලද්දේ වර්තමානයේ දැනුම් කේන්ද්‍රයෙහි පදනම ලෙස පාසල් අධ්‍යාපන පද්ධතියප්‍රතිනිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය (TSEP) යනුවෙන් හැඳින්වෙන අධ්‍යාපන ආංශික සංවර්ධන රාමුව හා වැඩසටහන (ESDFP)හා එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (UNICEF) හා ආසියානු සංවර්ධන බැංකු (ADB)ප්‍රතිපාදන මත ක්‍රියාත්මක වන අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩසටහන (ESDP) යන මූල්‍ය ප්‍රවාහ යටතේය.

විෂයමාලා සංවර්ධන කාර්යයට අමතර ව, 2014 වර්ෂය තුළ දී ද ජාතික අධ්‍යාපන ආයතනය විසින් ගුරුවරුන්, විදුහල්පතිවරුන් හා අධ්‍යාපන පරිපාලකයන් ඇතුළු 10,000 කට ආසන්න දේශීය හා විදේශීය ශාස්ත්‍රලාභීන් පිරිසක් උදෙසා වෘත්තීය සංවර්ධන පාඨමාලා රැසක් ක්‍රියාත්මක කළ අතර, මෙයින් ආයතනයේ වාර්ෂික පිරිවැයෙන් සැලකිය යුතු කොටසක් පියවා ගැනීමට තරම් ප්‍රමාණවත් ආදායමක් ලබා ගැනීමට ද ආයතනය සමත් වී ඇත. ඊට අමතරව 2014 වසරේ දී ඕස්ට්‍රේලියානු රජයේ මූල්‍ය ආධාර මත (DFAT) අ.පො.ස. උසස් පෙළ තෝරාගත් විෂය 06ක් සඳහා අතිරේක විෂයමාලා සම්පත් ග්‍රන්ථ සකස් කළ අතර, විෂය 13ක් සඳහා පරීක්ෂණ අයිතම ග්‍රන්ථ සකස් කිරීමට ද හැකි වූ අතර, ජර්මන් රජයේ ආධාර මත " සමාජ ඒකග්‍රතාව සඳහා අධ්‍යාපනය " (ESC) යන සංකල්පය මූලික කරගනිමින් තෝරාගත් විෂය කීපයක් සඳහා විෂයමාලා සහ අතිරේක විෂයමාලා ද්‍රව්‍ය සැකසීම සිදු කරන ලදී.

යථෝක්ත කාල පරිච්ඡේදය තුළ දී ජාතික අධ්‍යාපන ආයතනය මගින් උසස් පෙළ සඳහා හඳුන්වාදුන් නව තාක්ෂණ විෂය ධාරාවේ ගුරු අත්පොත් සැකසීම, පුහුණුකරුවන් පුහුණුකිරීම, විෂයමාලා ද්‍රව්‍ය සැකසීම, අ.පො.ස (සා.පෙ.) සිසුන් සඳහා ගණිතය පහසුවෙන් නම් ග්‍රන්ථ 12ක් සිංහල හා දෙමළ භාෂාවන්ගෙන් මුද්‍රණයකර පිටපත් 10,000ක් පමණ පාසල් පද්ධතිය තුළ බෙදාහැරීම. අ.පො.ස. (සා/පෙළ) ගණිත ප්‍රශ්න පත්‍රයට අදාල ප්‍රශ්න පත්‍ර බැංකුවක් පවත්වාගෙනයාම, පාසල් පද්ධතිය තුළ ගණිතය උගන්වන එහෙත් ගණිත පත්වීම් නොලද ගුරුවරුන් සඳහා විශේෂ පුහුණු වැඩ සටහනක් මගින් 500ක පමණ ගුරුවරුන් පිරිසක් පුහුණු කිරීම ප්‍රමුඛ කාර්යයන් ලෙස සම්පූර්ණකර ඇත.

තවද, අධ්‍යාපන ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලියෙහි අභිමතාර්ථ මුදුන්පත්කර ගැනීම සඳහා ජාතික අධ්‍යාපන ආයතනයේ පර්යේෂණ හා සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් 2014 වර්ෂය තුළ දී ක්‍රියාත්මක කළ පර්යේෂණ අතර, ශ්‍රී ලංකාවේ අනාගත අධ්‍යාපන පර්යේෂණවල දිශානතිය හඳුනාගැනීම සඳහා සිදුකළ පර්යේෂණය සහ ප්‍රාථමික (1හා 2 ශ්‍රේණි) පළමු ප්‍රධාන අවධියේ සිසුන්ගේ සවන්දීම පිළිබඳව සිදුකළ පර්යේෂණය ද ජාතික වශයෙන් වැදගත් විය. එසේ ම, අධ්‍යාපන අමාත්‍යාංශයේද සහයෝගිතාව ඇතිව මීගමුව අධ්‍යාපන කලාපයට අයත් 3 ශ්‍රේණියෙහි සිසුන්ගේ මව් බසට අදාළ නිපුණතා සංවර්ධනය පිළිබඳව සිදුකළ පර්යේෂණයෙහි වාර්තාව ප්‍රකාශයට පත් කර ඒ හා

සම්බන්ධ වගකිව යුතු අංශ දැනුවත් කර ඇත. ඉහත කාර්යයන්ට අමතරව SAARC Journal of Education Research සඟරාව ප්‍රකාශයට පත්කිරීමට අදාළ මූලික කරුණු සම්පූර්ණ කර ඇත. පර්යේෂණ විධික්‍රම පිළිබඳව විවිධ මාතෘකා ඔස්සේ පුහුණුකරුවන් 200ක පමණ කංඩායමක් ද පුහුණුකර ඇත. ජාතික අධ්‍යාපන ආයතනයෙහි ඉංග්‍රීසි දෙපාර්තමේන්තුව මගින් පාසල් පද්ධතිය තුළ ඉංග්‍රීසි භාෂාව ඉගෙනුම් -ඉගැන්වීම් ක්‍රියාවලිය පෝෂණය කිරීමට හේතුවන විශේෂ RESC සම්මන්ත්‍රණය 200 කට ආසන්න ඉංග්‍රීසි භාෂා පුහුණුකරුවන්ගේ සහභාගිත්වයෙන් 2014 වසරේ දී ද පැවැත්වීමට හැකි විය. නව තාක්ෂණ විෂය ධාරාවට අදාළ 2000 ක පමණ ගුරු උපදේශකවරුන් පුහුණු කිරීම ද 2014 වර්ෂය තුළ දී සැලසුම් කළපරිදි සිදුකර ඇත.

අධ්‍යයන කාර්ය මණ්ඩලයෙහි තනතුරු විශ්ව විද්‍යාල තනතුරු නාම හා සමාන වුව ද උසස් උපාධි සහිත ආයතන කාර්ය මණ්ඩලයේ හිගය අවම කරගැනිම සඳහා ලෝක බැංකුව හා ආසියානු සංවර්ධන බැංකුවේ මූල්‍ය අනුග්‍රහය ලබාගනිමින් මැලේසියාවේ විද්‍යා හා කළමනාකරණ විශ්ව විද්‍යාලයට අනුයුක්තව ආයතනයේ නිලධාරින් දස දෙනෙකුට ආචාර්ය උපාධි (PhD) හැදෑරීමට අවස්ථාව ලබා දීමට හැකි වීම ද ආයතනය ලැබූ විශේෂ ජයග්‍රහනයකි.

## 2.0 ජාතික අධ්‍යාපන ආයතන සංවිධාන ව්‍යුහය

### 2.1 ආයතන සභාව - 2014

ජාතික අධ්‍යාපන ආයතන පනත මගින් එහි ආයතන සභාව වෙත පහත සඳහන් බලතල පැවරී ඇත:

- ව්‍යවස්ථාවෙන් නියම කරන ලද බඳවා ගැනීමේ පටිපාටි හා පත් කිරීම් සම්බන්ධ ක්‍රියා පිළිවෙලට අනුව ආයතනයේ කාර්ය මණ්ඩලය පත් කිරීම;
- ආයතනයේ කාර්ය මණ්ඩලයේ සේවා සම්බන්ධ නියමයන් සහ කොන්දේසි, වැටුප්, වේතන හා අනෙකුත් පාරිතෝෂික ඇතුළු කාර්ය මණ්ඩල සේවා ගෙවීම් සම්බන්ධ නීති රීති තිරණය කිරීම;
- ආයතනයේ විනය සම්බන්ධ නීති රීති සම්පාදනය කිරීම;
- ආයතන කාර්ය මණ්ඩල ප්‍රතිලාභ හා අර්ථ සාධක ගෙවීම් සම්බන්ධ අරමුදල් ස්ථාපිත කිරීම හා විධිමත් කිරීම.

ජාතික අධ්‍යාපන ආයතන පනතට අනුව ආයතනය සම්බන්ධ මූල්‍ය හා පරිපාලන බලතල පැවරී ඇත්තේ ආයතන සභාවට ය. 2014 වසරේ ආයතන සභාව පහත සඳහන් සාමාජික සාමාජිකාවන්ගෙන් සමන්විත විය.

| | | |
|---|---|---|
| *අනුර දිසානායක මහතා* | - | *සභාපති* |
| *(ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය)* | | |
| *මහාචාර්ය ඩබ්ලිව්.එම්.අබේරත්න බණ්ඩාර මහතා* | - | *සාමාජික* |
| *(අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය)* | | |
| *මහාචාර්ය එස්.සන්දරසේගරම් මහතා* | - | *සාමාජික* |

*(හිටපු පීඨාධිපති, අධ්‍යාපන පීඨය, කොළඹ විශ්ව විද්‍යාලය)*

| | | |
|---|---|---|
| *මහාචාර්ය අර්ජුන ද සිල්වා මහතා*<br>*(වෛද්‍ය පීඨාධිපති, කැලණිය විශ්ව විද්‍යාලය)* | - | *සාමාජික* |
| *මහාචාර්ය මුදියන්සේ දිසානායක මහතා*<br>*(ජ්‍යෙෂ්ඨ මහාචාර්ය/අධ්‍යක්ෂ, දෘෂ්‍ය හා ප්‍රාසාංගික කලා විශ්වවිද්‍යාලය)* | - | *සාමාජික* |
| *මහාචාර්ය රෝලන්ඩ් අබේපාල මහතා*<br>*(ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, අධ්‍යාපන පීඨය, කොළඹ විශ්ව විද්‍යාලය)* | - | *සාමාජික* |
| *ආචාර්ය ටී.ඒ. පියසිරි මහතා*<br>*(උප කුලපති, වෘත්තීය තාක්ෂණ විශ්ව විද්‍යාලය)* | - | *සාමාජික* |
| *මංජුල මාකුඹුර මහතා*<br>*(නීතිඥ)* | - | *සාමාජික* |
| *පී. රණේපුර මහතා*<br>*(අතිරේක ලේකම්, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය)* | - | *සාමාජික* |
| *එම්.එෆ්.කේ නීසා මිය*<br>*(සහකාර අධ්‍යක්ෂ, ජාතික අයවැය දෙපාර්තමේන්තුව)* | - | *සාමාජික (2013.10.16 සිට)* |
| *වෛද්‍ය සාරාංග අලහප්පෙරුම මහතා*<br>*(අධ්‍යක්ෂ ජනරාල්, මධ්‍යම පරිසර අධිකාරිය)* | - | *සාමාජික* |
| *ජී.කේ. ඉද්දමල්ගොඩ මහතා*<br>*(අතිරේක සාමාන්‍යාධිකාරි, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය)* | - | *සාමාජික (2013.08.01 සිට)* |
| *වී.සි.ඩි.පී.පෙරේරා මිය*<br>*(අධ්‍යක්ෂ, බාහිර සම්පත් කළමනාකරණ ඒකකය, ජා.අ.ආ)* | - | *ආයතන සභා ලේකම්* |

## 2.2 ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය 2014

ආයතන සභාවට අමතර ව ආයතනයේ සියලු ම ශාස්ත්‍රීය කටයුතු සම්බන්ධයෙන් උපදෙස් දීමට අධ්‍යාපන, කළමනාකරණ, පරිපාලන හා වෙනත් ක්ෂේත්‍රවල ප්‍රවීණත්වයක් ඇති විද්වතුන්ගෙන් සමන්විත ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයක් පත් වන අතර, එමගින් ආයතනයේ පහත දැක්වෙන ශාස්ත්‍රීය කාර්ය හා සම්බන්ධයෙන් අධ්‍යාපනික නායකත්වය, සුපරීක්ෂණය සහ උපදේශනය ලබා දෙයි.

- සියලු ම ශාස්ත්‍රීය කාර්යවල දී ආයතන සභාවට උපදෙස් සැපයීම;
- ශාස්ත්‍රීය කටයුතු සම්බන්ධ ව ආයතන සභාව විසින් පවරන ලද කටයුතු සම්බන්ධයෙන් කරුණු සමාලෝචනය කොට වාර්තා කිරීම;

- ආයතනය විසින් පවත්වනු ලබන අධ්‍යයන පාඨමාලා, පුහුණු වැඩසටහන් සහ විභාග පිළිබඳ නිර්දේශ ආයතන සභාවට ඉදිරිපත් කිරීම;
- ආයතනය විසින් පවත්වනු ලබන අධ්‍යාපන පාඨමාලා, පුහුණු වැඩසටහන් හා විභාග සඳහා සිසුන් බඳවා ගැනීම පිළිබඳ නිර්දේශ ආයතන සභාවට ඉදිරිපත් කිරීම;
- ආයතනය විසින් පවත්වනු ලබන පාඨමාලා, පුහුණු වැඩසටහන් හෝ විභාග වලට අදාළ නීති රීති සම්පාදනය කිරීම හා ඒවා ආයතන සභාවට ඉදිරිපත් කිරීම;
- ආයතනය විසින් පවත්වනු ලබන විභාගවල දී විභාග පරීක්ෂකවරුන් වශයෙන් පත් කිරීමට සුදුසු අයගේ නම් ආයතන සභාවට නිර්දේශ කිරීම;
- ආයතන සභාව මඟින් අනුමත කොන්දේසි සම්පූර්ණ කරන ලද පුද්ගලයන් සඳහා ශිෂ්‍යත්ව, පදක්කම් සහ ත්‍යාග ප්‍රදානය කිරීම හා
- ආයතන සභාවේ අනුමැතිය ඇතිව විවිධ කමිටු සඳහා ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයට ඇතුළත් වන අය මෙන්ම ඉන් පරිබාහිර පුද්ගලයන් පත් කිරීම;

2014 වසරේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය සමන්විත වූයේ පහත දැක්වෙන විද්වතුන්ගෙනි.

| | | |
|---|---|---|
| *මහාචාර්ය ඩබ්ලිව්. ආරියදාස ද සිල්වා මහතා* | - | *සභාපති* |
| *(හිටපු පීඨාධිපති, අධ්‍යාපන පීඨය, කොළඹ විශ්ව විද්‍යාලය)* | | |
| *මහාචාර්ය ඩබ්ලිව්.එම්.අබේරත්න බණ්ඩාර මහතා* | - | *සාමාජික* |
| *(අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය)* | | |
| *මහාචාර්ය එස්.විදානපතිරණ මහතා* | - | *සාමාජික* |
| *(ක්ෂුද්‍ර ජීව විද්‍යා දෙපාර්තමේන්තුව, කැලණිය විශ්ව විද්‍යාලය)* | | |
| *මහාචාර්ය නාරද වර්ණසූරිය මහතා* | - | *සාමාජික* |
| *(හිටපු උපකුලපති, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය)* | | |
| *ආර්.එස්.මැදගම මහතා* | - | *සාමාජික* |
| *(විශ්‍රාමික අධ්‍යක්ෂ ජනරාල්, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හා ක්‍රියාත්මක කිරීමේ ඒකකය)* | | |
| *ඩබ්ලිව්.එම්.එන්.ජේ. පුෂ්ප කුමාර මහතා* | - | *සාමාජික* |
| *(විභාග කොමසාරිස් ජනරාල්, විභාග දොපර්තමේන්තුව)* | | |
| *වී. මුතුකුමාරස්වාමි මහතා* | - | *සාමාජික* |
| *(හිටපු විදුහල්පති, හින්දු විද්‍යාලය කොළඹ 04)* | | |
| *තිස්ස හේවාවිතාරණ මහතා* | - | *සාමාජික* |
| *(කොමසාරිස් ජනරාල්, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව)* | | |

| | | |
|---|---|---|
| *මහාචාර්ය සුදන්ත ලියනගේ* | - | *සාමාජික (2014.10.30 සිට)* |
| *(පීඨාධිපති, ව්‍යවහාරික විද්‍යා පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය)* | | |
| *එල්.එම්.ඩී. ධර්මසේන මහතා* | - | *සාමාජික (2014.10.30 සිට)* |
| *(විද්‍යා පීඨ කොමසාරිස්, අධ්‍යාපන අමාත්‍යංශය)* | | |
| *ආචාර්ය ප්‍රියන්ත ප්‍රේමකුමාර* | - | *සාමාජික (2014.11.20 සිට)* |
| *(ලේකම්, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම් සභාව)* | | |
| *මහාචාර්ය පී.සී.පී. ජවුෆර් මහතා නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්,* | - | *සාමාජික* |
| *(විකල්ප අධ්‍යාපන හා ගුරු අධ්‍යාපන පීඨය, ජා.අ.ආ.)* | | |
| *අයි.එම්.කේ.බී.ඉලංගසිංහ මහතා නි.අ.ජ./අධ්‍යාපන නායකත්ව* | - | *සාමාජික (2014.04.01දක්වා)* |
| *(සංවර්ධන කළමනාකරණ පීඨය, ජා.අ.ආ.)* | | |
| *එස්.එෆ්.ඒස්.පී. ජයවර්ධන මහතා* | - | *සාමාජික* |
| *(නි.අ.ජ. /විද්‍යා හා තාක්ෂණ පීඨය, ජා.අ.ආ)* | | |
| *පූජ්‍ය ආචාර්ය මාඹුල්ගොඩ සුමනරතන ස්වාමීන් වහන්සේ* | - | *සාමාජික* |
| *(නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය, ජා.අ.ආ.)* | | |
| *වී.සී.ඩී.පී. පෙරේරා මිය* | - | *ශාස්ත්‍රීය කටයුතු* |
| *(අධ්‍යක්ෂ, බාහිර සම්පත් කළමනාකරණ ඒකකය, ජා.අ.ආ)* | | *මණ්ඩල ලේකම්* |

### 2.3 අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය

අධ්‍යක්ෂ ජනරාල් ලේකම් කාර්යාලය, විභාග දෙපාර්තමේන්තුව, බාහිර සම්පත් කළමනාකරණ ඒකකය හා අභ්‍යන්තර විගණන අංශය අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සෘජු අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වේ. අධ්‍යක්ෂ ජනරාල් ලේකම් කාර්යාලය මගින් 2014 වසරේ දී ආයතන සභා රැස්වීම් 13 ක් ශාස්ත්‍රීය කටයුතු මණ්ඩල රැස්වීම් 16 ක් පවත්වා තිබේ.

2014 වසරේ දී ද ආයතනයේ අභ්‍යන්තර පරිපාලන ව්‍යූහය ශක්තිමත් කිරීම සඳහා අභ්‍යන්තර විගණන අංශය මගින් කාර්යක්ෂම විගණන සේවාවක් පවත්වා ගෙන යන ලදී.

### 2.4 පීඨ / අංශ

2014 වර්ෂයෙහි ආයතනයේ සංවිධාන ව්‍යූහය පහත සදහන් එක් එක් පීඨ සහ අංශ යටතේ ක්‍රියාත්මක විය.

#### 2.4.1 භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය

මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව
සිංහල භාෂා දෙපාර්තමේන්තුව
දෙමළභාෂා දෙපාරතමේන්තුව
ඉංග්‍රීසි භාෂා දෙපාර්තමේන්තුව
සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ආගම් දෙපාර්තමේන්තුව
සමාජ විද්‍යා දෙපාර්තමේන්තුව

### 2.4.2 විද්‍යා හා තාක්ෂණ පීඨය

විද්‍යා දෙපාර්තමේන්තුව

ගණිත දෙපාර්තමේන්තුව

තාක්ෂණික අධ්‍යාපන දෙපාර්තමේන්තුව

වාණිජ දෙපාර්තමේන්තුව

තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව

සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපන ඒකකය

මුද්‍රණ හා ප්‍රකාශන දෙපාර්තමේන්තුව

### 2.4.3 පර්යේෂණ හා සැලසුම් පීඨය

සැලසුම් හා ඇගයීම් දෙපාර්තමේන්තුව

පර්යේෂණ හා සංවර්ධන දෙපාර්තමේන්තුව

### 2.4.4 අධ්‍යාපන නායකත්ව සංවර්ධන හා කළමනාකරණ පීඨය

වෘත්තීය සංවර්ධන සහ අධ්‍යාපන කළමනාකරණ දෙපාර්තමේන්තුව

අධ්‍යාපන පරිපාලන හා සංවර්ධන දෙපාර්තමේන්තුව

විදේශීය පාඨමාලා ඒකකය

### 2.4.5 විකල්ප අධ්‍යාපන හා ගුරු අධ්‍යාපන පීඨය

අන්තර්කරණ අධ්‍යාපන දෙපාර්තමේන්තුව

සම්භාව්‍ය, විදේශීය භාෂා හා ද්විභාෂා අධ්‍යාපන දෙපාර්තමේන්තුව

විද්‍යුත් ප්‍රචාරණ දෙපාර්තමේන්තුව

මාර්ගෝපදේශන හා උපදේශන ඒකකය

විවෘත පාසල් ඒකකය

ගුරු අධ්‍යාපන දෙපාර්තමේන්තුව

ආයතනික සංවර්ධන දෙපාර්තමේන්තුව

### 2.4.6 පරිපාලන, මූල්‍ය හා සහාය සේවා අංශය

පරිපාලන හා මානව සම්පත් දෙපාර්තමේන්තුව

මුදල් දෙපාර්තමේන්තුව

ඉංජිනේරු හා නඩත්තු සේවා දෙපාර්තමේන්තුව

පුස්තකාල හා කෞතුකාගාර දෙපාර්තමේන්තුව

ප්‍රවාහන ඒකකය

## 3.0 2014 වර්ෂයේ විශේෂ සිදුවීම්

1. 2014 ජුලි 18 වන දින වාර්ෂික පරිත්‍රාන ධර්ම දේශනය පැවැත්වීම.
2. 2015 දී ක්‍රියාත්මක වන නව විෂයමාලාව පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් පළාත්වල ජ්‍යෙෂ්ඨ පරිපාලන හා අධ්‍යාපන නිළධාරීන් සඳහා සංවිධානය කිරීම සහ ඒ යටතේ උතුර සහ වයඹ පළාත්වල 88 දෙනෙකු සඳහා වැඩසටහන් 2ක් පැවැත්වීම.
3. ජාතික අධ්‍යාපන ආයතනයේ නිලධාරින්ට උසස් අධ්‍යාපන අවස්ථා ලබා ගැනීමට අවශ්‍ය පහසුකම් සැපයීමේ අරමුනෙන් පර්යේෂණ ක්‍රම සහ ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පාඨමාලා දෙකක් පැවැත්වීම.
4. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම් සභාව විසින් වෘත්තීය පාඨමාලා සඳහා හඳුන්වා දුන් ශ්‍රී ලංකා සුදුසුකම් රාමුවට අදාළ අවශ්‍යතාවලට ගැළපෙන ආකාරයට අධ්‍යාපනපති හා අධ්‍යාපනවේදී පාඨමාලාවල විෂය නිර්දේශය සකස් කිරීම ආරම්භ කිරීම.
5. කොරියාවේ හැන්යැන් විශ්ව විද්‍යාලයේ ප්‍රතිපාදන යටතේ තෝරා ගත් පාසල්වල සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපන ක්‍රියාකාරකම් සංවර්ධනය කිරීමට පාසල් සෞඛ්‍ය සංවර්ධන වැඩසටහනක් පැවැත්වීම.
6. ජාතික අධ්‍යාපන ආයතනයේ කාර්ය මණ්ඩල සංවර්ධන වැඩසටහන යටතේ නිලධාරින් 3 දෙනෙකු අධ්‍යාපනපති පාඨමාලාව හා නිලධාරින් 10 දෙනෙකු ආචාර්ය උපාධි පාඨමාලා හැදෑරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.
7. සංකල්ප ග්‍රහනය කිරීම සංවර්ධනය කිරීම යටතේ විද්‍යාව, ගණිතය සහ ඉංග්‍රීසි භාෂාව යන විෂය වල අ.පො.ස (සා.පෙළ) සාමාර්ථ වන සංඛ්‍යාව වැඩිකර ගැනිම සඳහා විශේෂ වැඩ සටහනනක් ආරම්භ කිරීම සහ ADB-ESDP ආධාර යටතේ පරික්ෂණ අයිතම හා අතිරේක කියවීම් පොත් සකස් කිරීම.

## 4.0 විෂයමාලා සංවර්ධනය

ජාතික අධ්‍යාපන ආයතනයේ විෂයමාලා සංවර්ධන කටයුතු ඉටු කරනු ලබන්නේ භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය සහ විද්‍යා හා තාක්ෂණ යන පීඨ මගිනි.
විෂයමාලා සම්පාදනය සඳහා ආයතනයට පැවරී ඇති බලතල යටතේ භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨයට අයත් දොපර්තමේන්තු 7ක්, තාක්ෂණ පීඨයට අයත් දෙපාර්තමේන්තු 5ක් හා විකල්ප අධ්‍යාපන හා ගුරු අධ්‍යාපන පීඨයට අයත් සම්භාව්‍ය, විදේශ භාෂා හා ද්විභාෂා අධ්‍යාපන දෙපාර්තමේන්තුව ද ඇතුළත්ව 2014 වර්ෂයේ දී විෂයමාලා සංවර්ධනය හා සම්බන්ධ ව්‍යාපෘති පනස් පහක් ක්‍රියාත්මක කරන ලදී. විෂයමාලා සංවර්ධන කාර්ය තුළින් පහත සඳහන් ප්‍රධාන අරමුණු ඉටුකර ගැනීමට අපේක්ෂා කළ අතර, යම් යම් බාධක මධ්‍යයේ වුව ද එම අපේක්ෂා වැඩි ප්‍රමාණයන් ලඟකාර ගැනීමට ජාතික අධ්‍යාපන ආයතනය සමත් වී ඇත.

- සමාජ, සංස්කෘතික, ආර්ථික සහ තාක්ෂණික අවශ්‍යතාවලට ගැළපෙන පරිදි විෂයමාලා සැලසුම් කිරීම, සංවර්ධනය කිරීම, පුනරීක්ෂණ සහ සංශෝධන කටයුතු කිරීම.
- විෂයමාලා නවීකරණ හා සමග ම අර්ථවත් ප්‍රායෝගික ඉගෙනුම් උගැන්වීම් ක්‍රියාවලියක් සඳහා වන නව විධික්‍රම පාසල් පද්ධතියට හඳුන්වා දීම.
- විෂයමාලා සංවර්ධන හා ක්‍රියාත්මක කිරීමේ කාර්යයෙහි නියුක්ත පිරිස්වල වෘත්තීය නිපුණතා වැඩි දියුණු කිරීම.
- විෂයමාලා සංවර්ධන හා ක්‍රියාත්මක කිරීම යන ක්ෂේත්‍රවල තොරතුරු අනාවරණය කර ගැනීම සඳහාත් අධ්‍යාපනයේ ගුණාත්මක ප්‍රවර්ධනය සඳහාත් ඉවහල් වන පර්යේෂණ අධ්‍යයන ක්‍රියාත්මක කිරීම.
- ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ හා ඇගයීම් ක්‍රියාමාර්ගවල සාර්ථකත්වය සඳහා නව විධික්‍රම හඳුන්වා දීම.
- ශිෂ්‍යයන්ගේ සන්නිවේදන, තොරතුරු තාක්ෂණ නිපුණතා සහ ජාතික හා ජාත්‍යන්තර භාෂා නිපුණතා සංවර්ධනය කිරීම.
- සංස්කෘතික හා ස්වාභාවික උරුමය රැක ගැනීමේ සහ ආරක්ෂා කර ගැනීමේ නිපුණතා සිසුන් තුළ ඇති කිරීම.
- සමාජයේ ජීවත් වන විවිධ ජන කණ්ඩායම්වලට ආවේණික ආගමික, සංස්කෘතික හා භාෂාමය වශයෙන් පවත්නා විවිධත්වය අගය කිරීමටත් ශ්‍රී ලාංකිකයන් ලෙස සැම දෙනාට ම එක් ව සිටීමටත් අවශ්‍ය නිපුණතා සංවර්ධනය කිරීම.

**විෂයමාලා සංවර්ධනය වෙනුවෙන් 2014 වර්ෂයේ දී නිම කළ විෂයමාලා කාර්ය පහත දැක්වේ.**

- 2015 සිට ක්‍රියත්මක කිරීමට නියමිත විෂයමාලාවේ 7 සහ 11 ශ්‍රේණි සඳහා ගුරු අත්පොත් 89ක් සැකසීම සහ 8 ශ්‍රේණිය සඳහා විෂය නිර්දේශ 35ක් සැකසීම විෂයමාලා සංවර්ධනය වෙනුවෙන් 2014 දී ඉටු කළ ප්‍රමුඛ කාර්යයකි.
- සිංහල භාෂාවේ විධිමත් භාවිතය සඳහා ඉවහල්වන"සිංහල ලේඛණ රීතිය" සංශෝධනය කටයුතු අවසන් කිරීම.
- සෞන්දර්ය විෂය ධාරාවේ 6 ශ්‍රේණිය සිට 10 ශ්‍රේණිය දක්වා ඉගෙනුම් සම්පත් පොත් 06ක් සකසා අවසන් කිරීම.
- අ.පො.ස. උ.පෙළ ජීව විද්‍යාව විෂයය සඳහා ඉගෙනුම් සම්පත් පොතක් සකස් කිරීම.
- රසායන විද්‍යාව, භෞතික විද්‍යාව හා අ.පො.ස. උ. පෙළ ගණිත විෂය සඳහා ඉගෙනුම් සම්පත්පොත් සංශෝධනය කිරීම.
- රසායන විද්‍යාව, භෞතික විද්‍යාව හා අ.පො.ස. (උ. පෙළ) ගණිත විෂය සඳහා ඉගෙනුම් සමීක්ෂණ පොත් සංශෝධනය කිරීම.
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂය සඳහා පාරිභාෂිත ශබ්ද කෝෂය සකස්කර අවසන් කිරීම.

- පවත්නා විෂයමාලාව ක්‍රියාත්මක කිරීම සඳහා සහ යෝජිත නව විෂයමාලාව යාවත්කාලීන කිරීම සඳහා ගුරු උපදේශකවරුන්, විෂය අධ්‍යක්ෂවරුන් සම්පත් දායකයන් හා ගුරුවරුන් 7000ක් සඳහාශක්‍යතා සංවර්ධන වැඩ සටහන් මගින් පුහුණු කිරීම.
- ප්‍රාථමික අධ්‍යාපනය (තෙවන ප්‍රධාන අවධිය) ඉගෙනුම් උගැන්වීම් ක්‍රියාවලිය දියුණු කිරීම සඳහා සකස් කළමොඩියුලය අවසන් කිරීම සහ පළාත් කාණ්ඩායම් ඒ සඳහා පුහුණු කිරීම.
- ප්‍රාථමික අධ්‍යාපනයේ පළමු ප්‍රධාන අවධියේ ගණිතය හා මවුබස විෂය සඳහා සායනික උගැන්වීම් ක්‍රියාකාරකම් හඳුනා ගැනීම සඳහා ගුරුවරුන් පුහුණු කිරීම.
- 6 සහ 11 ශ්‍රේණිවල ගුරු අත්පොත් ක්‍රියාකාරකම් සඳහා උපකාරිවන ඉලෙක්ට්‍රොනික ඉගෙනුම් ද්‍රව්‍ය සකස් කිරීම.
- අ.පො.ස. උසස් පෙළ භරත නාට්‍ය විෂයමාලාව සඳහා ආධාරවන DVDවැඩසටහනක් නිර්මාණය කිරීම සහ උසස් පෙළ ඉතිහාසය විෂයය සඳහා සිතියම් පොතක් සැකසීම.
- ජීව විද්‍යාව, රසායන විද්‍යාව, භෞතික විද්‍යා යන විෂය සඳහා සංයුක්ත තැටි නිර්මාණයට අවශ්‍ය තිරපිටපත් සකස් කිරීම.
- අ.පො.ස. උසස් පෙළ තොරතුරු සන්නිවේදන තාක්ෂණවේද විෂයය නියාමනය සඳහා අධ්‍යයනයක් සිදු කිරීම.
- GIT හාICT යන විෂය සඳහා ප්‍රශ්න පත්‍ර බැංකුවක් සැකසීම.
- අ.පො.ස. සාමාන්‍ය පෙළ හා උසස් පෙළ ඉගෙනුම් ද්‍රව්‍ය 4ක් සකස්කොට අවසන් කිරීම.
- ආර්ථික විද්‍යාව සහ ව්‍යාපාර අධ්‍යයනය යන විෂය සඳහා LMS 24ක් සකස් කිරීම.
- ද්විභාෂා අධ්‍යාපනය පිළිබඳව සංකල්ප පත්‍රිකා (Concept papers) 05ක් සැකසීම.
- අ.පො.ස. (සා/පෙළ) සිසුන් සඳහා "ගණිතය පහසුවෙන්" නම් ග්‍රන්ථ 12ක් සිංහල හා දෙමළ භාෂාවලින් මුද්‍රණයකර පිටපත් 10,000/- පමණ පාසල් පද්ධතිය තුළ බෙදා හැරීම.
- 10 සහ 11 ශ්‍රේණිවල සිසුන්ගේ ගණිත විෂයය අධ්‍යයනය පිළිබඳව ශක්තීන් හා දුබලතා හඳුනාගැනීම සඳහා අධ්‍යයනයක් ආරම්භ කිරීම.
- 6,9 ශ්‍රේණි වල විෂය අන්තර්ගතය සඳහා අනාවරණ පරික්ෂණ අඩංගු පොත් කට්ටල 10ක් සැකසීම.
- අ.පො.ස.(සා/පෙළ) ගණිතය විෂයයට අදාළ අයිතම 1000ක් අඩංගු ප්‍රශ්න පත්‍ර බැංකුවක් පවත්වාගෙන යෑම
- බ්‍රේල් අධ්‍යාපනය පිළිබඳ පාඨමාලාවක් සකස් කිරීම.
- අන්තර්කරණ අධ්‍යාපනය පිළිබඳව සඟරාවක් සකස් කිරීම.

**ගුරු අත්පොත් පිළියෙළ කිරීම - 2014**

විෂයමාලා ක්‍රියාත්මක කිරීමේ සැලැස්මට අනුව 2015 වසරේ සිට පාසල් පද්ධතියට හඳුන්වාදීමට නියමිත 6 සහ 10 ශ්‍රේණි වලට අදාළ ගුරු අත්පොත් සැකසීම, 2016 වසරේ දී හඳුන්වාදීමට නියමිත 7 සහ 11 ශ්‍රේණි සඳහා වූ ගුරු අත්පොත් සැකසීමේ කටයුතු මේ යටතේ ඉටු කොට ඇත.

- බුද්ධ ධර්මය (සිංහල) - 6 ශ්‍රේණිය
- ක්‍රිස්තියානි ධර්මය (සිංහල) - 6 ශ්‍රේණිය
- කතෝලික ධර්මය (සිංහල/දෙමළ) - 6 ශ්‍රේණිය
- ප්‍රායෝගික හා තාක්ෂණික කුසලතා (සිංහල/දෙමළ) - 6 ශ්‍රේණිය
- දෙවන ජාතික භාෂාව - දෙමළ - 6 ශ්‍රේණිය
- පුරවැසි අධ්‍යාපනය(සිංහල /දෙමළ/ඉංග්‍රීසි) - 6 ශ්‍රේණිය
- භූගෝල විද්‍යාව(සිංහල /දෙමළ/ඉංග්‍රීසි) - 6 ශ්‍රේණිය
- පෙරදිග සංගීතය (සිංහල) - 6 ශ්‍රේණිය
- නර්තනය (සිංහල) - 6 ශ්‍රේණිය
- බටහිර සංගීතය - 6 ශ්‍රේණිය
- චිත්‍ර (සිංහල/දෙමළ) - 6 ශ්‍රේණිය
- නාට්‍ය හා රංගකලාව (සිංහල/දෙමළ) - 6 ශ්‍රේණිය
- ඉංග්‍රීසි භාෂාව - 6 ශ්‍රේණිය
- ගණිතය (සිංහල /දෙමළ/ඉංග්‍රීසි) - 6 ශ්‍රේණිය
- හින්දු ධර්මය - 6 ශ්‍රේණිය
- භරත නාට්‍ය - 6 ශ්‍රේණිය
- කර්ණාටක සංගීතය (දෙමළ) - 6 ශ්‍රේණිය
- ඉතිහාසය (සිංහල /දෙමළ/ඉංග්‍රීසි) - 6 ශ්‍රේණිය
- දෙමළ භාෂාව හා සාහිත්‍යය - 6 ශ්‍රේණිය
- සිංහල භාෂාව හා සාහිත්‍යය - 6 ශ්‍රේණිය
- සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය - 6 ශ්‍රේණිය
  (සිංහල /දෙමළ/ඉංග්‍රීසි)
- විද්‍යාව (සිංහල /දෙමළ/ඉංග්‍රීසි) - 6 ශ්‍රේණිය
- ඉස්ලාම් ධර්මය (සිංහල /දෙමළ) - 6 ශ්‍රේණිය
- භරත නාට්‍ය - 7 ශ්‍රේණිය
- දෙවන ජාතික භාෂාව - සිංහල - 7 ශ්‍රේණිය
- කතෝලික ධර්මය (සිංහල/දෙමළ) - 7 ශ්‍රේණිය
- සිංහල භාෂාව හා සාහිත්‍යය - 7 ශ්‍රේණිය
- ඉංග්‍රීසි භාෂාව හා සාහිත්‍යය - 7 ශ්‍රේණිය
- බුද්ධ ධර්මය - 7 ශ්‍රේණිය
- ඉස්ලාම් ධර්මය - 7 ශ්‍රේණිය
- හින්දු ධර්මය - 7 ශ්‍රේණිය
- නැටුම් - 7 ශ්‍රේණිය
- භූගෝල විද්‍යාව(සිංහල/දෙමළ) - 7 ශ්‍රේණිය

- නාට්‍ය හා රංගකලාව (සිංහල/දෙමළ) - 7 ශ්‍රේණිය
- සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය - 7 ශ්‍රේණිය
  (සිංහල /දෙමළ/ඉංග්‍රීසි)
- ගණිතය (සිංහල /දෙමළ/ඉංග්‍රීසි) - 7 ශ්‍රේණිය
- පෙරදිග සංගීතය - 7 ශ්‍රේණිය
- පුරවැසි අධ්‍යාපනය (සිංහල /දෙමළ) - 7 ශ්‍රේණිය
- කර්ණාටක සංගීතය - 7 ශ්‍රේණිය
- ඉතිහාසය (සිංහල /දෙමළ) - 7 ශ්‍රේණිය
- දෙවන ජාතික භාෂාව - දෙමළ - 7 ශ්‍රේණිය
- විද්‍යාව (සිංහල /දෙමළ/ඉංග්‍රීසි) - 7 ශ්‍රේණිය.
- චිත්‍ර (සිංහල) - 7 ශ්‍රේණිය
- බුද්ධ ධර්මය (සිංහල) - 10 ශ්‍රේණිය
- ක්‍රිස්තියානි ධර්මය (සිංහල/දෙමළ) - 10 ශ්‍රේණිය
- කලා ශිල්ප (සිංහල/දෙමළ)
- ගෘහ ආර්ථික විද්‍යාව - 10 ශ්‍රේණිය
- ජලජ ජීව සම්පත් තාක්ෂණවේදය - 10 ශ්‍රේණිය
  (සිංහල/දෙමළ)
- නිර්මාණකරණය හා ඉදිකිරීම් තාක්ෂණය - 10 ශ්‍රේණිය
  (සිංහල/දෙමළ)
- නිර්මාණකරණය හා යාන්ත්‍රික තාක්ෂණය - 10 ශ්‍රේණිය
  (සිංහල/දෙමළ)
- නිර්මාණකරණය, විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික - 10 ශ්‍රේණිය
  තාක්ෂණය (සිංහල/දෙමළ)
- දෙවන ජාතික භාෂාව - දෙමළ - 10 ශ්‍රේණිය
- භූගෝල විද්‍යාව(සිංහල/දෙමළ/ඉංග්‍රිසි) - 10 ශ්‍රේණිය
- පුරවැසි අධ්‍යාපනය (සිංහල /දෙමළ/ඉංග්‍රීසි) - 10 ශ්‍රේණිය
- පෙරදිග සංගීතය (සිංහල) - 10 ශ්‍රේණිය
- නැටුම් (සිංහල) - 10 ශ්‍රේණිය
- බටහිර සංගීතය - 10 ශ්‍රේණිය
- චිත්‍ර (සිංහල) - 10 ශ්‍රේණිය
- නාට්‍ය හා රංගකලාව (සිංහල/දෙමළ) - 10 ශ්‍රේණිය
- ඉංග්‍රීසි භාෂාව - 10 ශ්‍රේණිය
- පාලි භාෂාව - 10 ශ්‍රේණිය
- සංස්කෘත භාෂාව - 10 ශ්‍රේණිය
- හින්දි භාෂාව - 10 ශ්‍රේණිය
- චීන භාෂාව - 10 ශ්‍රේණිය

- ජපන් භාෂාව - 10 ශ්‍රේණිය
- රුසියන් භාෂාව - 10 ශ්‍රේණිය
- ජර්මන් භාෂාව - 10 ශ්‍රේණිය
- හින්දු ධර්මය - 10 ශ්‍රේණිය
- භරත නාට්‍ය - 10 ශ්‍රේණිය
- ව්‍යාපාර හා ගිණුම්කරණය (සිංහල /දෙමළ/ඉංග්‍රීසි) - 10 ශ්‍රේණිය
- චිත්‍ර(දෙමළ) - 10 ශ්‍රේණිය
- කර්නාටක සංගීතය (දෙමළ) - 10 ශ්‍රේණිය
- ඉතිහාසය (සිංහල /දෙමළ/ඉංග්‍රීසි) - 10 ශ්‍රේණිය
- ව්‍යවසායකත්ව අධ්‍යයනය (සිංහල /දෙමළ/ඉංග්‍රීසි) - 10ශ්‍රේණිය
- දෙමළ භාෂාව හා සාහිත්‍යය - 10 ශ්‍රේණිය
- දෙමළ සාහිත්‍ය රසාස්වාදය - 10 ශ්‍රේණිය
- තොරතුරු තාක්ෂණය හා සන්නිවේදනය (සිංහල /දෙමළ/ඉංග්‍රීසි) - 10 ශ්‍රේණිය
- සිංහල භාෂාව හා සාහිත්‍යය - 10 ශ්‍රේණිය
- සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය (සිංහල /දෙමළ/ඉංග්‍රීසි) - 10 ශ්‍රේණිය
- විද්‍යාව (සිංහල /දෙමළ/ඉංග්‍රීසි) - 10 ශ්‍රේණිය
- ඉස්ලාම් ධර්මය (සිංහල /දෙමළ) - 10 ශ්‍රේණිය
- සිංහල සාහිත්‍ය රසාස්වාදය - 10 හා 11 ශ්‍රේණිය
- දෙමළ භාෂාව හා සාහිත්‍යය - 11 ශ්‍රේණිය
- දෙමළ සාහිත්‍ය රසාස්වාදය - 11 ශ්‍රේණිය
- පෙරදිග සංගීතය (සිංහල/දෙමළ) - 11 ශ්‍රේණිය
- දෙවන ජාතික භාෂාව - සිංහල - 11 ශ්‍රේණිය
- කතෝලික ධර්මය (සිංහල /දෙමළ) - 11 ශ්‍රේණිය
- සිංහල භාෂාව හා සාහිත්‍යය - 11 ශ්‍රේණිය
- ඉංග්‍රීසි භාෂාව හා සාහිත්‍යය - 11 ශ්‍රේණිය
- බුද්ධ ධර්මය - 11 ශ්‍රේණිය
- ඉස්ලාම් ධර්මය (දෙමළ) - 11 ශ්‍රේණිය
- ක්‍රිස්තියානි ධර්මය (සිංහල /දෙමළ) - 11 ශ්‍රේණිය
- හින්දු ධර්මය - 11 ශ්‍රේණිය
- නිර්මාණකරණය හා යාන්ත්‍රික තාක්ෂණය (සිංහල/දෙමළ) - 11 ශ්‍රේණිය
- නිර්මාණකරණය හා ඉදිකිරීම් තාක්ෂණය (සිංහල/දෙමළ) - 11 ශ්‍රේණිය
- නිර්මාණකරණය, විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික තාක්ෂණය (සිංහල/දෙමළ) - 11 ශ්‍රේණිය
- කලා ශිල්ප (සිංහල/දෙමළ) - 11 ශ්‍රේණිය

- නැටුම් - 11 ශ්‍රේණිය
- භරත නාට්‍ය - 11 ශ්‍රේණිය
- නාට්‍ය හා රංගකලාව (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) - 11 ශ්‍රේණිය
- ගණිතය (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) - 11 ශ්‍රේණිය
- පෙරදිග සංගීතය (සිංහල) - 11 ශ්‍රේණිය
- පුරවැසි අධ්‍යාපනය (සිංහල /දෙමළ/ ඉංග්‍රීසි) - 11 ශ්‍රේණිය
- හින්දි භාෂාව - 11 ශ්‍රේණිය
- ජර්මන් භාෂාව - 11 ශ්‍රේණිය
- සංස්කෘත භාෂාව - 11 ශ්‍රේණිය
- ජපන් භාෂාව - 11 ශ්‍රේණිය
- කොරියන් භාෂාව - 11 ශ්‍රේණිය
- කර්නාටක සංගීතය - 11 ශ්‍රේණිය
- චිත්‍ර (සිංහල) - 11 ශ්‍රේණිය
- කෘෂි හා ආහාර තාක්ෂණය - 11 ශ්‍රේණිය
- ජලජ ජීව සම්පත් තාක්ෂණවේදය - 11 ශ්‍රේණිය
- ගෘහ විද්‍යාව - 11 ශ්‍රේණිය
- භූගෝල විද්‍යාව (සිංහල/දෙමළ) - 11 ශ්‍රේණිය
- දෙමළ භාෂාව හා සාහිත්‍ය - 11 ශ්‍රේණිය
- දෙමළ සාහිත්‍යය රසාස්වාදය - 11 ශ්‍රේණිය
- දෙවන ජාතික භාෂාව - දෙමළ - 11 ශ්‍රේණිය
- පාලි භාෂාව (සිංහල) - 11 ශ්‍රේණිය
- ඉතිහාසය (සිංහල/දෙමළ) - 11 ශ්‍රේණිය
- ඉංජිනේරු තාක්ෂණවේදය(සිංහල/දෙමළ) - 12 හා 13 ශ්‍රේණිය
- ජෛව පද්ධති තාක්ෂණවේදය (සිංහල/දෙමළ) - 12 හා 13 ශ්‍රේණිය
- තාක්ෂණය සඳහා විද්‍යාව (සිංහල/දෙමළ) - 12 හා 13 ශ්‍රේණිය

**විෂය නිර්දේශය - 2014**

මේ යටතේ 2016 වසරේ දී පාසල් පද්ධතියට හඳුන්වා දීමට නියමිත 7 සහ 11 ශ්‍රේණි විෂය නිර්දේශ සකස් කිරීම නිමකරන ලදී.

- ඉතිහාසය (සිංහල /දෙමළ/ඉංග්‍රීසි) - 7 ශ්‍රේණිය
- නර්තනය (දෙමළ) - 7 ශ්‍රේණිය
- කර්ණාටක සංගීතය - 7 ශ්‍රේණිය
- බටහිර සංගීතය - 7 ශ්‍රේණිය
- භරත නාට්‍ය - 7 ශ්‍රේණිය
- දෙවන ජාතික භාෂාව - දෙමළ - 7 ශ්‍රේණිය
- ප්‍රායෝගික හා තාක්ෂණික කුසලතා (සිංහල /දෙමළ/ඉංග්‍රීසි) - 7 ශ්‍රේණිය
- පුරවැසි අධ්‍යාපනය(සිංහල /දෙමළ/ඉංග්‍රීසි) - 7 ශ්‍රේණිය

- භරත නාට්‍ය - 7 ශ්‍රේණිය
- දෙවන ජාතික භාෂාව - සිංහල - 7 ශ්‍රේණිය
- ඉතිහාසය (සිංහල /දෙමළ/ඉංග්‍රීසි) - 7 ශ්‍රේණිය
- ඉංග්‍රීසි භාෂාව හා සාහිත්‍යය - 7 ශ්‍රේණිය
- නර්තනය (දෙමළ) - 7 ශ්‍රේණිය
- බටහිර සංගීතය (සිංහල /දෙමළ/ඉංග්‍රීසි) - 7 ශ්‍රේණිය
- නිර්මාණකරණය විද්‍යුත් හා ඉලෙක්ට්‍රොනික තාක්ෂණය (සිංහල/දෙමළ) - 10 හා 11ශ්‍රේණිය
- දෙවන ජාතික භාෂාව - සිංහල - 11 ශ්‍රේණිය
- පුරවැසි අධ්‍යාපනය (සිංහල /දෙමළ/ඉංග්‍රීසි) - 11 ශ්‍රේණිය
- ගෘහ ආර්ථික විද්‍යාව - 11 ශ්‍රේණිය
- භරත නාට්‍ය - 11 ශ්‍රේණිය
- ඉතිහාසය (සිංහල /දෙමළ/ඉංග්‍රීසි) - 11 ශ්‍රේණිය
- ඉංග්‍රීසි භාෂාව - 11 ශ්‍රේණිය
- නර්තනය (දෙමළ) - 11 ශ්‍රේණිය
- පාලි භාෂාව - 11 ශ්‍රේණිය
- හින්දි භාෂාව - 11 ශ්‍රේණිය
- චීන භාෂාව - 11 ශ්‍රේණිය
- ජර්මන් භාෂාව - 11 ශ්‍රේණිය
- ජපන් භාෂාව - 11 ශ්‍රේණිය
- බටහිර සංගීතය (සිංහල /දෙමළ/ඉංග්‍රීසි) - 11 ශ්‍රේණිය
- චිත්‍ර (සිංහල/දෙමළ) - 11 ශ්‍රේණිය
- කර්නාටක සංගීතය - 11 ශ්‍රේණිය
- භූගෝල විද්‍යාව (සිංහල/දෙමළ) - 11 ශ්‍රේණිය
- නාට්‍ය හා රංගකලාව (සිංහල/දෙමළ) - 11 ශ්‍රේණිය
- සංස්කෘත භාෂාව - 11 ශ්‍රේණිය
- කොරියන් භාෂාව - 11 ශ්‍රේණිය
- තාක්ෂණය සඳහා විද්‍යාව (සිංහල/දෙමළ) - 11 ශ්‍රේණිය

විෂයමාලාව හා සම්බන්ධ ඉහත සඳහන් විෂය නිර්දේශ හා ගුරු අත්පොත් සකස් කිරීමට අමතරව අතිරේක විෂයමාලා ද්‍රව්‍ය සකස් කිරීම ද ජාතික අධ්‍යාපන ආයතනය විසින් ඉටු කරයි. 2014 වසරේ දී පහත සඳහන් අතිරේක විෂයමාලා ද්‍රව්‍ය සකසා අවසන් කිරීමට ජාතික අධ්‍යාපන ආයතනයට හැකි විය.

**සෞන්දර්ය විෂයයන් සඳහා අතිරේක කියවීම් පොත් පිළියෙළ කිරීම**

සෞන්දර්ය විෂය සඳහා පෙළ පොත් සකස් කිරීමක් නොකරන බැවින් එම විෂය සඳහා අතිරේක කියවීම් පොත් සකස් කිරීමේ අවශ්‍යතාව කලක සිට පැවති අතර, එය ඉටුකිරීම සඳහා අවශ්‍ය කටයුතු 2014 වසරේ දී ක්‍රියාත්මක කරන ලදී.

- චිත්‍ර (සිංහල/දෙමළ) - 6-10 ශ්‍රේණි
- කර්ණාටක සංගීතය (සිංහල/දෙමළ) - 6-10 ශ්‍රේණි

- නර්තනය (සිංහල/දෙමළ) - 6-10 ශ්‍රේණි
- නාට්‍ය හා රංග කලාව (සිංහල /දෙමළ) - 6-10 ශ්‍රේණි
- පෙරදිග සංගීතය (සිංහල/දෙමළ) - 10 ශ්‍රේණිය
- බටහිර සංගීතය (සිංහල/දෙමළ) - 10 ශ්‍රේණිය

**විද්‍යාව හා තොරතුරු තාක්ෂණය සඳහා අතිරේක කියවීම් පොත් පිළියෙල කිරීම**

අ.පො.ස. (උසස් පෙළ)ජීව විද්‍යාව රසායන විද්‍යාව හා භෞතික විද්‍යාව සඳහා පොත් 13ක් සිංහල හා දෙමළ මාධ්‍යවලින් සකස් කිරීම.

සාමාන්‍ය තොරතුරු තාක්ෂණය සහ තොරතුරු තාක්ෂණය සඳහා (GIT& IT) ආදර්ශ ප්‍රශ්න පත්‍ර පොතක් සකස් කිරීම.

**ගණිතය සඳහා අතිරේක කියවීම් පොත් සහ ආදර්ශ ප්‍රශ්න පත්‍ර සැකසීම**

ගණිතය විෂය ඉගෙනුම් උගැන්වීම් ක්‍රමවේද සුසාධ්‍ය කිරීම පිණිසත් අ.පො.ස. සාමාන්‍ය පෙළ හා උසස් පෙළ විභාගවල සමත් වීමේ ප්‍රතිශයත වැඩි කිරීම සඳහාත් ඉලක්ක කරගනිමින් පහත සඳහන් අතිරේක විෂයමාලා ද්‍රව්‍ය 2014 වසරේ දී සකසා ඇත.

- අ.පො.ස. (උසස්/පෙළ) ගණිතය විෂය සඳහා අතිරේක විෂයමාලා ද්‍රව්‍ය පොත් 8ක් සිංහල / දෙමළ මධ්‍යාවලින් සැකසීම.
- අ.පො.ස. (උසස් පෙළ) සංයුක්ත ගණිතය සඳහා ආදර්ශ ප්‍රශ්න පත්‍ර සැකසීම
- විජ ගණිතය (1 හා 2)
- සම්භාවිතාව හා සංඛ්‍යානය අතිරේක කියවීම් පොත් 02ක් සැකසීම
- ගණිතය පහසුයි - ජ්‍යාමිතිය (සිංහල / දෙමළ)
- ගණිතය පහසුයි - කුලක හා සම්භාවිතාව (සිංහල / දෙමළ)
- ගණිතය පහසුයි - සංඛ්‍යානය (සිංහල / දෙමළ)
- ගණිතය පහසුයි - සංඛ්‍යා
- ගණිතය පහසුයි - මිනුම්කරණය (සිංහල /දෙමළ)
- ගණිතය පහසුයි - විජ ගණිතය (සිංහල / දෙමළ)
- පැවරුම්
- ආදර්ශ ප්‍රශ්න පත්‍ර කට්ටලය - 11 ශ්‍රේණිය

**යථාවත් කරන ලද විෂයමාලාව පිළිබඳව විෂය අධ්‍යක්ෂවරුන්, විදුහල්පතිවරුන්, ගුරු උපදේශකවරුන් හා ගුරුවරුන් දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම.**

පවත්නා විෂයමාලා චක්‍රයට අනුව යථාවත් කරන ලද විෂයමාලාව පාසල් පද්ධතියේ 6 සහ 10 ශ්‍රේණි සඳහා ක්‍රියාත්මක කිරීම 2015 වසරේ ආරම්භ කිරීමට නියමිතව තිබූ අතර, ඒ සඳහා පළාත් විෂය අධ්‍යක්ෂවරුන්, විදුහල්පතිවරුන්, ගුරු උපදේශකවරුන් සහ ගුරුවරුන් දැනුවත් කිරීමේ කටයුතු 2014 සැප්තැම්බර් මාසය අවසන් වීමට පෙර නිම කිරීමට අවශ්‍ය වැඩකටයුතු සැලසුම් කර තිබුණි. පළාත්වල ඉල්ලීම් මත ඊට පසුව ද යථෝක්ත වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමට ජාතික අධ්‍යාපන ආයතනයට සිදුවිය. ඒ අනුව සියළුම පළාත් ඇතුළත් වන පරිදි පළාත් සහ කලාපවල විෂය අධ්‍යක්ෂවරුන්, විදුහල්පතිවරුන්, ගුරු උපදේශකවරුන් සහ ගුරුවරුන් 9307 දෙනෙකු දැනුවත් කිරීමට ජාතික අධ්‍යාපන ආයතනයට හැකිවිය. ඒ පිළිබඳ සංඛ්‍යා පහත සඳහන් වෙයි.

| | |
|---|---|
| විෂය අධ්‍යක්ෂවරු | 280 |
| විදුහල්පතිවරු | 88 |
| ගුරු උපදේශකවරු | 8170 |
| ගුරුවරු | 116 |
| **එකතුව** | **9307** |

## 5.0 අධ්‍යාපන නායකත්ව සංවර්ධනය හා වෘත්තීය සංවර්ධන අවස්ථා වැඩිදියුණු කිරීම

අධ්‍යාපන ක්ෂේත්‍රයේ නියැළි පුද්ගලයන්ගේ වෘත්තීය සංවර්ධනය වැඩිදියුණු කිරීම ආයතනයට පැවරී ඇති ප්‍රධාන කාර්යවලින් එකකි.

යථෝක්ත කර්තව්‍යය සාක්ෂාත් කෙරෙනුයේ අධ්‍යාපන දර්ශනපති පාඨමාලාවේ සිට සහතික පත්‍ර පාඨමාලා දක්වා පරාසයක ක්‍රියාත්මක වන ශික්ෂණ කාර්ය පටිපාටියකිනි. ඒ හා සම්බන්ධ සියළුම අධ්‍යාපන කළමනාකරණ සංවර්ධන පාඨමාලා මීපේ පරිශ්‍රයෙහි පැවැත්වෙන අතර, අනෙකුත් වෘත්තීය සංවර්ධන පාඨමාලා ජාතික අධ්‍යාපන ආයතන පරිශ්‍රයේ දී පැවැත්වෙයි. ඊට අමතරව දිවයිනේ විවිධ ප්‍රදේශවල වාසය කරන අධ්‍යාපන ක්ෂේත්‍රයේ නියුතුවූවන්ට අධ්‍යාපනවේදී, පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා හා අතිරේක භාෂා ප්‍රවීණතා පාඨමාලාවලට සහභාගිවීමේ අවස්ථාව සපයනු පිණිස ප්‍රාදේශිය මධ්‍යස්ථාන ද ස්ථාපිත කර ඇත. මේ පිළිබඳ වැඩිපුර තොරතුරු පහත වගු අංක 01 හි ඇතුළත් කර ඇත

01 වන වගුව - වෘත්තීය සංවර්ධන පාඨමාලා පිළිබඳ විස්තර - 2014

| පාඨමාලාව | වගකීම දරන දෙපාර්තමේන්තුව | පාඨමාලාව පැවැත්වෙන ස්ථානය | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|
| **පශ්චාත් උපාධි පාඨමාලා** | | | |
| අධ්‍යාපන දර්ශනපති උපාධි පාඨමාලාව | ගුරු අධ්‍යාපන | ජා.අ.ආ. | 10 |
| අධ්‍යාපනපති පාඨමාලාව | ගුරු අධ්‍යාපන | ජා.අ.ආ./යාපනය | 220 |
| අධ්‍යාපන කළමනාකරණ විද්‍යාපති පශ්චාත් උපාධි පාඨමාලාව | වෘත්තීය සංවර්ධන සහ අධ්‍යාපන කළමනාකරණ | මීපේ | 50 |
| **පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා** | | | |
| පශ්චාත් උපාධි අධ්‍යාපන කළමනාකරණ ඩිප්ලෝමා (පූර්ණකාලීන යන අර්ධකාලීන පාඨමාලාව | වෘත්තීය සංවර්ධන සහ අධ්‍යාපන කළමනාකරණ | මීපේ | 80 |
| පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව | ගුරු අධ්‍යාපන | ජා.අ.ආ /ප්‍රාදේශීය මධ්‍යස්ථාන 24 | 2377 |
| පශ්චාත් උපාධි පාසල් උපදේශන ඩිප්ලෝමා පාඨමාලාව | ගුරු අධ්‍යාපන | ජා.අ.ආ. | 23 |
| **උපාධි පාඨමාලා** | | | |
| අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාව | ගුරු අධ්‍යාපන | ජා.අ.ආ/මධ්‍යස්ථාන 38 | 3969 |
| **ඩිප්ලෝමා පාඨමාලා** | | | |
| පාසල් කළමනාකාරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව | අධ්‍යාපන කළමනාකරණ | මීපේ | 187 |
| දෙවන බසක් ලෙස ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව | ඉංග්‍රීසි | ජා.අ.ආ | 29 |
| පූර්ව ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව | ප්‍රාථමික අධ්‍යාපනය | ජා.අ.ආ | 76 |
| විශේෂ අධ්‍යාපනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව | අන්තර්කරණ අධ්‍යාපන | ජා.අ.ආ. | 53 |
| සංඥා භාෂා ඩිප්ලෝමා පාඨමාලාව | අන්තර්කරණ අධ්‍යාපන | ජා.අ.ආ | 20 |
| **සහතික පත්‍ර පාඨමාලා** | | | |
| අතිරේක භාෂා සංවර්ධන පාඨමාලාව | ගුරු අධ්‍යාපන | ජා.අ.ආ/මධ්‍යස්ථාන 38 | 625 |
| **කෙටිකාලීන පාඨමාලා** | | | |
| අධ්‍යාපන කළමනාකරණය පිළිබඳ කෙටිකාලීන තේමා පාඨමාලාව | වෘත්තීය සංවර්ධන හා අධ්‍යාපන කළමනාකරණ | මීපේ | 726 |
| විදුහල්පති පාඨමාලාව | වෘත්තීය සංවර්ධන හා අධ්‍යාපන කළමනාකරණ | මීපේ | 1500 |
| **විදේශිය සිසුන් සඳහා වන පාඨමාලා** | | | |
| අධ්‍යාපන කළමනාකරණය පිළිබඳ විද්‍යාපති පශ්චාත් උපාධි පාඨමාලාව | වෘත්තීය සංවර්ධන හා අධ්‍යාපන කළමනාකරණ | මීපේ | 23 |

**අධ්‍යාපන කළමනාකරණ තේමා සඳහා මොඩියුල පිළියෙල කිරීම**

මීපේ අධ්‍යාපන කළමනාකරණ මධ්‍යස්ථානයේ පැවැත්වෙන විවිධ කළමනාකරණ පාඨමාලා සඳහා භාවිත කිරීම සඳහා විවිධ කළමනාකරණ තේමා පාදක කරගත් පහත සඳහන් මොඩියුල සකස් කිරීම සිදු කරන අතර, 2014 වසරේ දී පහත සඳහන් මොඩියුල සකස් කොට මුද්‍රණය කර බෙදා හැරීමට අවශ්‍ය පියවර ගන්නා ලදී.

- පාසල් තුල ගුණාත්මක වර්ධනය සඳහා ප්‍රමති ඇතිකිරීම.
- පාසල් සංවර්ධන වැඩ සටහන (PSI)(සිංහල)
- අධ්‍යාපන නීතිය (සිංහල)
- මානව සම්පත් කළමණාකරණය (සිංහල)
- අධ්‍යාපන කළමනාකරණයෙහි මනෝවිද්‍යාත්මක පැතිකඩ (සිංහල)
- කළමනාකරණය (සිංහල)
- විෂයමාලා කළමානාකරණය (සිංහල)
- පාසල් සංවර්ධනය සැලසුම්ගත කිරීම (සිංහල)

## 5.1 ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල හා ගුරු විද්‍යාලවල ගුණාත්මක සංවර්ධනය

ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ හරහා පූර්ව සේවා ගුරු අධ්‍යාපන විෂයමාලා ක්‍රියාත්මක කිරීම මෙන්ම ගුරු මධ්‍යස්ථාන හරහා සේවාස්ථ ගුරු අධ්‍යාපනය සංවර්ධනය කිරීමත් ජාතික අධ්‍යාපන ආයතනයට අයත් වගකීමකි. ඒ අනුව 2014 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය තුළ පහත දැක්වෙන කාර්යපූර්ව සේවා හා සේවාස්ථ ගුරු පුහුණුවට අදාළව ජාතික අධ්‍යාපන ආයතනය විසින් ඉටුකර ඇත.

ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල ගුරු පුහුණු කටයුතු සඳහා අවශ්‍ය සමාජ විද්‍යා විෂය ධාරාවට අදාළ අතිරේක විෂයමාලා පොත් 3ක් (සිංහල /දෙමළ/ඉංග්‍රීසි) භාෂාවලින් සකස් කිරීමක් ගුරු අධ්‍යාපනඥයන් 50 දෙනෙකු පුහුණු කිරීම.

## 5.2 ජාතික අධ්‍යාපන ආයතනය විසින් ක්‍රියාත්මක කරනු ලබන විවිධ පාඨමාලා සඳහා විභාග පැවැත්වීම.

ආයතනය විසින් පවත්වනු ලබන විභාගවලට අදාළ වූ විභාග පටිපාටි සවිමත් කිරීමට හැකිවීම 2014 ජනවාරි - දෙසැම්බර් කාලය තුළ ආයතනය ලබාගත් විශේෂ ප්‍රගතියකි. ඒ යටතේ පහත සඳහන් විභාග 20ක් පවත්වා ඇත.

- අධ්‍යාපනවේදී පාඨමාලාව (අවසාන)
- පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව (2 කොටස)
- විශේෂ අධ්‍යාපනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (අවසාන)

- අතිරේක භාෂා සංවර්ධන පාඨමාලාව (සිංහල /දෙමළ /ඉංග්‍රීසි)
- කොරියානු භාෂා ඩිප්ලෝමා පාඨමාලාව
- අතිරේක භාෂා සංවර්ධන පාඨමාලාව (වාචික)
- අධ්‍යාපනවේදි උපාධි පාඨමාලාව (අවසාන)
- පාසල් උපදේශනය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව
- පාසල් කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව
- කොරියානු භාෂාව පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව
- පාසල් කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව (අවසාන පූර්ණ කාලීන හා අර්ධ කාලීන පාඨමාලාව)
- පූර්ව ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව
- දෙවන බසක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (අවසාන)
- කොරියානු භාෂා ඩිප්ලෝමා පාඨමාලාව (1 අදියර)
- කොරියානු භාෂාව පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව(IIIඅදියර)
- ඒකාබද්ධ සන්නිවේදන නිලධාරින් බඳවා ගැනිම සඳහා වූ තරග විභාගය (NWSDB)
- පුස්තකාල සහ තොරතුරු තාක්ෂණය පිළිබඳ උසස් පුහුණු සහතික පත්‍ර පාඨමාලාව
- කොරියානු භාෂාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (III අදියර)
- අධ්‍යාපනපති ප්‍රවේශ විභාගය
- තාක්ෂණික විෂයධාරාව සඳහා ගුරුවරුන් බඳවා ගැනිමේ තරග විභාගය

## 6.0 විකල්ප අධ්‍යාපනය

විකල්ප අධ්‍යාපන පීඨය යටතේ ක්‍රියාත්මක වන අන්තර්කරණ අධ්‍යාපන, විද්‍යුත් ප්‍රචාරණ දෙපාර්තමේන්තු හා මාර්ගෝපදේශන හා උපදේශන අංශය මගින් 2014 වර්ෂය තුළ ඉටුකළ කාර්ය පහත සඳහන් වෙයි.

## 6.1 අන්තර්කරණ අධ්‍යාපනය

" සැමට අධ්‍යාපනය" යන සංකල්පය යථාර්ථයක් බවට පත් කර ගැනීමේ දී අන්තර්කරණ අධ්‍යාපන දෙපාර්තමේන්තුවට විශේෂ ස්ථානයක් හිමිවේ. විශේෂ අවශ්‍යතා සහිත දරුවන් සඳහා යෝග්‍ය වන පරිදි විෂයමාලාව සංවර්ධනය කිරීම, විශේෂ අධ්‍යාපන ගුරුවරුන්ට හා ගුරු උපදේශකවරුන් සඳහා අවශ්‍ය පුහුණු කටයුතු සිදුකිරීම හා අතිරේක විෂයමාලා ද්‍රව්‍ය සම්පාදනය වැනි කාර්යවල වගකීම පැවරී ඇත්තේ අන්තර්කරණ අධ්‍යාපන දෙපාර්තමේන්තුවටය. ඊට අමතරව එමගින් විශේෂ අධ්‍යාපන ඩිප්ලෝමා, සංඥා භාෂා ඩිප්ලෝමා ආදි පාඨමාලා ඔස්සේ වෘත්තීය සංවර්ධන අවස්ථා සම්පාදනය කෙරේ. අදාළ කාලපරිච්ඡේදය තුළ උක්ත දෙපාර්තමේන්තුව විසින් ඉටුකරන ලද කාර්ය පහත සඳහන් වෙයි.

- බ්‍රේල් අධ්‍යාපන පුහුණු පැකේජය යාවත්කාලීන කිරීම හා මෘදු කුසලතා සංවර්ධනය සඳහා වැඩමුළු 04 ක් පැවැත්වීම සහ පුහුණු පැකේජයක් උපයෝගී කර ගනිමින් ඉගෙනුම් දුෂ්කරතා සහිත ළමයින්ට ඉගැන්වීම පිළිබඳ ව ගුරුවරුන් හා ගුරු උපදේශකවරුන් 80 දෙනෙකු පුහුණු කිරීම.
- සිංහල හා භූගෝලවිද්‍යා විෂය සඳහා සංඥා භාෂා ශබ්ද කෝෂ ලිවීම ආරම්භ කිරීම.
- සංඥා භාෂාව පිළිබඳව සංයුක්ත තැටියක් සකස් කිරීම.
- අන්තර්කරණ අධ්‍යාපන සඟරාව එළිදැක්වීම.
- රත්මලාන බිහිරි විද්‍යාලයෙහි ගුරුවරු 30දෙනෙකු පමණ පුහුණු කිරීම.
- විශේෂ අවශ්‍යතා සහිත දරුවන් 65දෙනෙකු තක්සේරුකරණය කිරීම.
- සමාජ සේවා අමාත්‍යංශයෙහි සංඥා භාෂා පාඨමාලාව සඳහා අවශ්‍ය මගපෙන්වීම ලබාදීම.

## 6.2 විද්‍යුත් ප්‍රචාරණය

නොවිධිමත් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඉතා ප්‍රබල මෙන් ම ආකර්ශණීය ඉගෙනුම්- ඉගැන්වීම් මෙවලමක් ලෙස ප්‍රයෝජනයට ගන්නා රූපවාහිනිය, ගුවන්විදුලිය හා සංයුක්ත තැටි බඳු ඉලෙක්ට්‍රොනික ඉගෙනුම් ද්‍රව්‍ය භාවිත කරමින් පාසල් ප්‍රජාව පමණක් නොව, ඊට පරිබාහිර විවිධ සමාජ කණ්ඩායම් ඉගෙනුම් සමාජයක් කරා ගෙන යෑමේ කාර්යභාරය විද්‍යුත් ප්‍රචාරණ දෙපාර්තමේන්තුව ඉටු කරයි. විෂයමාලාවේ දුරවබෝධ සංකල්ප පැහැදිලි කරලීම සඳහාත්, විෂයමාලාවේ කරන වෙනස්කම් පිළිබඳ ව ප්‍රජාව දැනුවත් කිරීම සඳහාත්, ගීතය, සංගීතය, නාට්‍ය වැනි සෞන්දර්යාත්මක මාධ්‍ය යොදා ගනිමින් ජන මනස පුබුදුවාලීම සඳහාත් විවිධ වැඩ සටහන් නිෂ්පාදනය කිරීම විද්‍යුත් ප්‍රචාරණ දෙපාර්තමේන්තුව විසින් ආයතනය ආරම්භයේ සිට ම කර ගෙන එනු ලබයි.

2014 වර්ෂයේ මෙම දෙපාර්තමේන්තුවෙන් ඉටු කරන ලද කටයුතුවල ප්‍රගතිය පහත සඳහන් වෙයි.

- " නැණස" නාලිකාව සඳහා අධ්‍යාපන වැඩ සටහන් 03 ක් නිෂ්පාදනය කිරීම සහ තිර පිටපත් 50ක් අවසන් කිරීම.
- "ජීවන නිපුණතාවක් ලෙස ඉංග්‍රීසි " ව්‍යාපෘතිය යටතේ ඉංග්‍රීසි බස ඉගැන්වීම සඳහා උපකාරී කරගත හැකි වැඩසටහන් 15ක් නිෂ්පාදනය කිරීම.
- "සුසර සංහිඳ" වැඩසටහන් 11ක් නිෂ්පාදනය කර විකාශනය කිරීම.
- "නිපුණ" වැඩ සටහන් 23ක්, "මේ අපේ පාසලයි" වැඩසටහන් 23ක් සහ කාලීන ප්‍රස්තුත පදනම් කරගත් වැඩ සටහන් 25ක් නිෂ්පාදනය කිරීම.

### 6.3 මාර්ගෝපදේශන හා උපදේශන සේවා

2004 වර්ෂයේ ශ්‍රී ලංකාවට මුහුණ දීමට සිදු වූ සුනාමි ව්‍යසනය සමඟ හටගත් පාසල් පද්ධතිය හා සම්බන්ධ ප්‍රජාවගේ මානසික ව්‍යාකුලතාව නැති කිරීම සඳහා මනෝ සමාජයීය මැදිහත් වීමක් ලබාදීමේ අරමුණ ඇතිව 2006 වසරේ ජූනි මස උපදේශන හා මාර්ගෝපදේශන ඒකකය ජාතික අධ්‍යාපන ආයතනයෙහි ස්ථාපිත කරන ලදි. ඉගෙනුමට ප්‍රියමනාව පරිසරයක් ඇතිකරන, වෘත්තීය පුහුණුව තුළින් ගුරු භවතුන්ට සහය වීම මගින් දරුවන්ගේ ආත්ම විශ්වාසය හා ආත්මාභිමානය ඇති කිරීම සඳහා යොමු කිරීමට අවශ්‍ය දැනුම හා කුසලතා ලගාකර දීම ඒ යටතේ සිදුකරන ප්‍රධාන කාර්ය වෙයි. ශිෂ්‍ය ප්‍රජාව සඳහා වෘත්තීය මාර්ගෝපදේශන හා උපදේශන සේවා සැපයීම ද මෙම ඒකකයට පැවරී ඇති තවත් වගකීමකි. 2014 වර්ෂය අවසාන වන විට මෙම ඒකකය විසින් සම්පූර්ණ කරන ලද කාර්ය පහත සඳහන් වෙයි.

- පාසල් සිසුන් හා දෙමාපියන් 78 දෙනෙකු සඳහා අභ්‍යන්තරික ව උපදේශන සැසි පැවැත්වීම.
- පාසල් මට්ටමේ ගැටලුවලට ඉල්ලීම පදනම කරගත් උපදේශන සැසි 06ක් පැවැත්වීම.
- පොදු දේශන 03ක් සංවිධානය කිරීම.
- ගුරුවරුන් 50ක් සඳහා උපදේශනය සම්බන්ධව පුහුණු කිරීම
- උපදේශන හා මාර්ගෝපදේශනය ඩිප්ලෝමා පාඨමාලාව සඳහා අනුමැතිය ලබාගැනීම.

### 6.4 විවෘත ඉගෙනුම

විවිධ හේතු නිසා පාසල් අධ්‍යාපනය අහිමි වූ පුද්ගලයන්ට අධ්‍යාපනයේ මංපෙත් විවෘත කර දීම සඳහා දුරස්ථ පාඨමාලා පැවැත්වීම අරමුණු කරගෙන විවෘත පාසල් දෙපාර්තමේන්තුව පිහිටුවා තිබේ. විවෘත පාසල දුරස්ථ හා විවෘත ඉගෙනුම් ක්‍රම උපයෝගි කර ගනිමින් අධ්‍යාපනය ඉගෙනුම් ලාභියා වෙතට ගෙන යන ක්‍රියාවලියකි. අධ්‍යාපන සුදුසුකම්, රැකියාවක යෙදී සිටීම හෝ සමාජ ආර්ථික පසුබිම ආදී කිසිවක් නොසලකා සියලු දෙනාටම අධ්‍යාපනය ලබාදීමේ අවස්ථා පුළුල් කිරීමක් එමගින් අපේක්ෂා කෙරේ. ඉගෙනුම් ලභියාගේ අභිමතය පරිදි ඉගෙනුම ආරම්භ කර තමා කැමති මාධ්‍යයක් උපයෝගි කරගනිමින් උචිත පියවරක සිට ඉගෙනීම සඳහා විවෘත පාසල පහසුකම් සපයයි.

2014 වර්ෂය තුළ දී මෙම දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන කාර්ය ඉටුකරනු ලැබ ඇත.

- විවෘත ප්‍රාථමික පාඨමාලාව සහ විවෘත ද්විතීයික පාඨමාලාව යනුවෙන් පාඨමාලා 2ක් පවත්වා ගෙන යාම හා එම පාඨමාලාවලට අදාළ අතිරේක විෂයමාලා පොත් 02ක් සකස් කිරීම.
- ප්‍රාදේශීය මධ්‍යස්ථාන 04ක් අධීක්ෂනය කිරීම.
- ප්‍රාදේශිය පුහුණුකරුවන්ගේ පුහුණු අවශ්‍යතා හඳුනාගැනීම.
- විවෘත පාසල් ඉගෙනුම්ලාභින් සඳහා සැසි 30ක් පැවැත්වීම.

## 7.0 පර්යේෂණ, සැලසුම් හා සංවර්ධනය

අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය උදෙසා විෂයමාලා සංවර්ධනය, වෘත්තීය සංවර්ධනය සහ අධ්‍යාපන ප්‍රතිපත්ති සම්පාදනය සඳහා ඉවහල් වන විවිධ පර්යේෂණ කිරීම ජාතික අධ්‍යාපන ආයතනය මගින් ඉටු කරන අතර, යථෝක්ත කාර්ය යථාර්ථයක් බවට පත්කිරීම සඳහා අවශ්‍ය කටයුතු පර්යේෂණ දෙපාර්තමේන්තුව යටතේත් ආයතනයේ කාර්ය ඉටුකිරීම සඳහා අවශ්‍ය මූල්‍ය සම්පත් ලබා දීම සඳහා අවශ්‍ය සම්බන්ධිකරණය සහ නියාමනය සැලසුම් හා ඇගයීම් දෙපාර්තමේන්තුව යටතේත් ක්‍රියාත්මක වෙයි.

## 7.1 පර්යේෂණ හා සංවර්ධන දෙපාර්තමේන්තුව

අධ්‍යාපන පර්යේෂණ ආරම්භ කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ පවත්වා ගෙන යාම සහ නියාමනය අධ්‍යාපනයේ විවාදාත්මක අංශ සම්බන්ධ ව අදහස් හා මත සංවාදය සඳහා සාකච්ඡා මණ්ඩප සැලසුම් කිරීම, අධ්‍යාපනයේ නියැළි පිරිස් තුළ පර්යේෂණ කුසලතා ප්‍රවර්ධනය සඳහා අවස්ථා සම්පාදනය, පුද්ගලයන්ට සහ ආයතනවලට පර්යේෂණ ප්‍රදාන ලබාදීමෙන් පර්යේෂණ හැකියා සංවර්ධනයට අවස්ථා සැලසීම සහ පර්යේෂණ තොරතුරු ප්‍රචලිත කිරීම පර්යේෂණ හා සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්යභාරය වෙයි. මෙම දෙපාර්තමේන්තුව විසින් 2014 ජනවාරි - දෙසැම්බර් කාලසීමාව තුළ නිම කරන ලද කාර්ය පහත සඳහන් වෙයි.

- ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පර්යේෂණයන්හි දිශානතීන් හඳුනා ගැනීමේ අවශ්‍යතා සමීක්ෂණය සිදුකිරීම.
- "පශ්චාත් කන්නන්ගර යුගයේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පිළිබඳ සමාලෝචනයක්" යන මැයෙන් 25 වැනි කන්නන්ගර අනුස්මණ දේශනය අධ්‍යාපන අමාත්‍යංශයෙහි හිටපු උපදේශක ආර්.එස්. මැදගම මහතා විසින් පවත්වනු ලැබීම.
- සාර්ක් (SAARC) අධ්‍යාපන පර්යේෂණ සඟරාවේ 10 වැනි වෙළුමෙහි අවසන් පිටපත සකස් කිරීම.
- 1 සහ 2 ශ්‍රේණිවල සිසුන්ගේ අවධානය පිළිබඳව වූ පර්යේෂණ අධ්‍යයනය සිදුකිරීම.

## 7.2 සැලසුම් හා ඇගයීම් දෙපාර්තමේන්තුව

ආයතනය සතු භෞතික, මූල්‍ය හා මානව සම්පත් කාර්යක්ෂමව හා ඵලදායී ලෙස උපයෝගී කර ගනිමින්, ආයතනයේ අරමුණු හා ඉලක්ක, ජාතික අරමුණු හා ඒකාබද්ධ කිරීමේ අභිලාෂය ඇති ව කටයුතු කිරීම සැලසුම් හා ඇගයීම් දෙපාර්තමේන්තුවේ කාර්යභාරයයි.
2014 වසරේ සැලසුම් හා ඇගයීම් දෙපාර්තමේන්තුව ඉටුකළ ප්‍රමුඛ කාර්ය පහත සඳහන් වෙයි.

- කාර්තුමය ප්‍රගතිවාර්තා, වාර්ෂික ප්‍රගති වාර්තා සහ කාර්ය සාධන වාර්තා සකස් කිරීම.
- 2015 වර්ෂයට අදාළ අයවැය ඇස්තමේන්තුව සහ 2015 අයවැය වාර්තාව, 2016 - 2019 පස් අවුරුදු සැලැස්ම සහ වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම සකස් කිරීම.
- 2014 ප්‍රසම්පාදන සැලැස්ම සහ දෙපාර්තමේන්තු අවශ්‍යතා සැලකිල්ලට ගෙන ලී බඩු සහ කාර්යාලීය උපකරණ ලැයිස්තු සකස් කිරීම.
- මහ බැංකුව, අධ්‍යාපන අමාත්‍යාංශය, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසම් සභාව ආදි ආයතන වල ඉල්ලීම පරිදි ප්‍රගති වාර්තා සකස් කිරීම.

## 7.3 බාහිර සබඳතා

ආයතන නිලධාරීන්ගේ වෘත්තීය සංවර්ධනය සදහා ඉවහල් වන විවිධ පාඨමාලා සඳහා ආයතනයේ කාර්ය මණ්ඩලයට අවස්ථා සලසා දීම බාහිර සබදතා ඒකකයේ ප්‍රධාන වගකීම වේ. එයට අමතර ව පාසල් අධ්‍යාපන පද්ධතිය දූනුම් කේන්ද්‍රයක පදනම බවට පරිවර්තනය කිරීමේ ව්‍යාපෘතිය (TSEP ) සඳහා ලෝක බැංකුව මගින් ද, දූනුමැති සමාජයක් උදෙසා අධ්‍යාපන වැඩසටහන (EKSP) සඳහා ආසියානු සංවර්ධන බැංකුව මගින් ද ජාතික එකාබද්ධතාව හා ආපදා කළමනාකරණය සඳහා GIZ ආයතනය මගින් හා ප්‍රාථමික අධ්‍යාපනය සඳහා (UNICEF) ආයතනය මගින් ද සපයන මුල්‍යාධාර සම්බන්ධීකරණ කටයුතු මෙම ඒකකය මගින් ඉටු කරයි.

බාහිර සබඳතා ඒකකය මගින් 2014 වර්ෂය තුළ දී පහත සදහන් කාර්ය ඉටු කරන ලදී.

- බාහිර සම්පත් කළමනාකරණ ඒකකය මගින් විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව, 2014 ජනවාරි - දෙසැම්බර් කාලය තුළ ආයතනයේ නිලධාරීන් 17 දෙනෙකු සඳහා විදේශ වැඩමුළු හා සම්මන්ත්‍රණ සඳහා සහභාගීවීමට අවස්ථා සම්පාදනය කිරීම.
- ජාතික අධ්‍යාපන ආයතනය සහ මැලේසියාවේ මලයා විශ්ව විද්‍යාලය අතර අත්සන් කළ අවබෝධතා ගිවිසුම අනුව ආයතනයේ නිලධාරින් 03 දෙනෙකු සඳහා පශ්චාත් උපාධි පාඨමාලාවක් හැදූරීම සඳහා අවස්ථාව ලබාදීම.
- ලෝක බැංකුවේ සහ ආසියානු සංවර්ධන බැංකුවේ මුල්‍ය අනුග්‍රහය මත අධ්‍යයන නිලධාරින් 10දෙනෙකු සඳහා මැලේසියාවේ Science & Management විශ්වවිද්‍යාලයෙහි ආචාර්ය උපාධි හැදූරීමට අවස්ථාව ලබාදීම.

## 8.0 පරිපාලන, මූල්‍ය හා සහායක සේවා

ආයතනයේ විෂයමාලා සංවර්ධන, අධ්‍යාපන නායකත්ව සංවර්ධන හා ගුරු අධ්‍යාපන, සැමට අධ්‍යාපන, පර්යේෂණ සැලසුම් හා සංවර්ධන පීඨ මගින් කරනු ලබන සියලු ම කාර්ය සඳහා මූල්‍ය, භෞතික සම්පත් හා කළමනාකරණ සේවා සම්පාදනය සහ සහාය සේවා සැපයීම, පරිපාලන, මුල්‍ය හා සහායක සේවා අංශයේ ප්‍රධාන කාර්යභාරයයි. ඒ යටතේ ක්‍රියාත්මක වන ඒ ඒ දෙපාර්තමේන්තු ඉටුකරන ලද කාර්ය පහත සඳහන් වෙයි.

## 8.1 පරිපාලන දෙපාර්තමේන්තුව

ආයතනයේ එදිනෙදා පරිපාලන කාර්ය හා සම්බන්ධ සියලු ම කටයුතු හා කාර්ය මණ්ඩල පුහුණු අවශ්‍යතා හඳුනාගෙන ඔවුන්ට අදාළ පුහුණු අවස්ථා ලබා දීමේ කටයුතු මානව සම්පත් සංවර්ධන හා පාලන දොපර්තමේන්තුව මගින් සිදු කරයි.

එදිනෙදා ඉටුකරනු ලබන සාමාන්‍ය පරිපාලන රාජකාරි කටයුතු වලට අමතරව, 2014 ජනවාරි - දෙසැම්බර් කාලසීමාව ඇතුළත පරිපාලන දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන බඳවා ගැනීම් සිදු කර ඇත.

**බඳවා ගැනීම්**

| | | |
|---|---|---|
| සහකාර අධ්‍යක්ෂ ජනරාල් | - | 03 |
| අධ්‍යක්ෂ | - | 02 |
| ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | - | 01 |
| සහකාර කථිකාචාර්ය | - | 06 |
| කළමනාකාර සහකාර | - | 06 |
| රියදුරු | - | 01 |
| කාර්යාල ආධාරක | - | 03 |
| සහකාර අධ්‍යක්ෂ මුදල් | - | 01 |
| මාධ්‍ය කාර්මික ශිල්පි | - | 01 |
| පරිඝනක ග්‍රැෆික් ඩිසයිනර් | - | 01 |
| පොත් තබන්නා | - | 01 |
| පුස්තකාල සහකාර | - | 02 |
| විගණන සහකාර | - | 02 |

- ආයතනයේ විවිධ තනතුරු දරන නිලධාරින් 19 දෙනෙකු සඳහා උසස්වීම් ලබාදීම.
- ඊට අමතර ව ආයතනයේ අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ නිලධාරීන් 15 දෙනෙකුගේ පාඨමාලා සම්බන්ධ ඉල්ලීම් සඳහා මූල්‍ය ප්‍රතිපාදන මෙන් ම අධ්‍යයන නිවාඩු ලබා දීම ද ඉටු කොට ඇත.

## 8.2 මුදල් දෙපාර්තමේන්තුව

ආයතනයේ සියලු ම කාර්ය සඳහා මූල්‍ය සම්පත් ලබා දීම, ආදායම් හා පිරිවැය වාර්තා මූල්‍ය නීතිරීති අනුව පවත්වාගෙන යෑමේ කටයුතු මුදල් දොපර්තමේන්තුව මගින් සිදු කරයි. ඒ යටතේ එම දෙපාර්තමේන්තුව ඉටු කළ ප්‍රධාන වැඩසටහන් පහත සඳහන් වෙයි.

- ස්ථාවර වත්කම් ලේඛනය හා ඇගයීම් පටිපාටි සකස් කොට අවසන් කිරීම.
- 2014 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය අවසන් කිරීම.
- 2014 වර්ෂයේ මුල්‍ය ප්‍රකාශය පිළිබඳ අවසන් වාර්තාව සකස් කිරීම.

## 8.3 ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුව

ආයතනයේ ගොඩනැගිලි ඉදිකිරීම, නඩත්තු කටයුතු, විදුලි සහ දුරකථන සේවා පවත්වා ගෙන යාම, යටිතල පහසුකම් සැපයීම, පවිත්‍රතා සහ ආරක්ෂක සේවා සම්බන්ධීකරණය හා ආයතනයේ භෞතික පරිසරය අධ්‍යාපනික කාර්යවලට සමීප වන අයුරින් පවත්වාගෙන යෑම ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුව මගින් ඉටුකරනු ලැබේ.

ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුව මගින් 2014 දෙසැම්බර් වන විට ඉටුකර ඇති කාර්ය පහත දැක්වේ.

- නව ශ්‍රවනාගාරයේ ප්‍රතිසංස්කරණ කටයුතු සහ මල ජල අපවහන පද්ධතිය නවීකරණය කිරීම.
- මහරගම සහ මීපේ පරිශ්‍රයෙහි ලොකු කුඩා ප්‍රතිසංස්කරණ හා අලුත්වැඩියා කටයුතු 31ක් සම්පූර්ණ කිරීම.

## 8.4 පුස්තකාල සේවා

ජාතික අධ්‍යාපන ආයතනයේ පුස්තකාලය අධ්‍යාපන විෂය ක්ෂේත්‍රය හා සම්බන්ධ විශ්වවිද්‍යාල කථිකාචාර්යවරුන්, ගුරුවරුන් හා සිසුන් මෙන්ම අධ්‍යාපන විද්‍යාපීඨ හා ගුරු විදුහල් කථිකාචාර්යවරුන් සහ වෙනත් ආයතනවල අධ්‍යාපනඥයින්ගේ නිරන්තර පරිහරණයට බඳුන් වේ. එම පුස්තකාලයට 2014 වසරේ දී අලුතින් එකතු කරගන්නා ලද පොත් පත් හා සංයුක්ත තැටි ප්‍රමාණය පහත දැක්වේ.

| | |
|---|---|
| පොත් | 1846 |
| පොත් (පරිත්‍යාග) | 128 |
| විෂයමාලා ද්‍රව්‍ය | 1156 |
| අධ්‍යාපනික වාර්තා | 129 |
| දේශීය වාර සඟරා (පරිත්‍යාග) | 10 |
| දේශීය වාර සඟරා | 05 |
| විදේශීය වාර සඟරා (පරිත්‍යාග) | 10 |

## 8.5 මුද්‍රණ හා ප්‍රකාශන

මුද්‍රණ හා ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් අදාළ කාලසීමාව තුළ මුද්‍රණය කරන ලද ප්‍රකාශන වර්ගය හා ප්‍රමාණය පහත දැක්වේ.

| | | | |
|---|---|---|---|
| 1. | ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ | - | 20 |
| 2. | අතිරේක විෂයමාලා ද්‍රව්‍ය | - | 140 |
| 3. | වෙනත් ප්‍රකාශන | - | 71 |
| 4. | සහතික | - | 15 |
| 5. | මොඩියුල අමතර කියවීම් පොත් | - | 06 |
| 6. | විෂය නිර්දේශය | - | 44 |

පාර්ලිමේන්තු පනත මගින් ආයතනයට පැවරී ඇති කාර්ය නියමිත පරිදි ඉටුකිරීම සඳහා ආයතනයේ දැනට සිටින කාර්ය මණ්ඩලය විවිධ අපහසුතා මධ්‍යයේ වුවද දැඩි කැපකිරීමක් සිදු කළ අතර, එම අපහසුතාව සඳහා ප්‍රධාන වශයෙන් බලපාන ලද්දේ කාර්යමණ්ඩල හිගයයි. 2014 වර්ෂය ආරම්භ වන අවස්ථාව වනවිට 652ක් වූ අනුමත කාර්යමණ්ඩලයේ පුරප්පාඩු 188ක් පැවතුණි. පහත සඳහන් වගුව 2014 වසර ආරම්භ වනවිට ආයතනයේ පැවති කාර්යමණ්ඩල තත්වය පිළිබඳව පැහැදිලි චිත්‍රයක් ලබාදෙයි.

| තනතුර | අනුමත කාර්ය මණ්ඩලය (01.01.2014 දිනට) | පවත්නා කාර්ය මණ්ඩලය (01.01.2014 දිනට) | | | පුරප්පාඩු සංඛ්‍යාව (01.01.2014 දිනට) |
|---|---|---|---|---|---|
| | | පුරුෂ | ස්ත්‍රී | සම්පූර්ණ | |
| අධ්‍යක්ෂ ජනරාල් | 01 | 01 | 00 | 01 | 00 |
| අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | 01 | 00 | 00 | 00 | 01 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් | 06 | 06 | 00 | 06 | 00 |
| අධ්‍යක්ෂ | 27 | 11 | 06 | 17 | 10 |
| සභා ලේකම් (අධ්‍යාපන) | 01 | 00 | 00 | 00 | 01 |
| ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය /ජ්‍යෙෂ්ඨ අධ්‍යාපනඥ | 72 | 27 | 14 | 41 | 31 |
| කථිකාචාර්ය / අධ්‍යාපනඥ | 75 | 28 | 29 | 57 | 18 |
| සහකාර කථිකාචාර්ය / සහකාර අධ්‍යාපනඥ | 90 | 13 | 16 | 29 | 61 |
| අනධ්‍යයන කාර්ය මණ්ඩලය | 379 | 154 | 159 | 313 | 66 |
| **එකතුව** | **652** | **240** | **224** | **464** | **188** |

ආයතනයේ සිටි පළපුරුදු කාර්යමණ්ඩල සමාජිකයන් 21 දෙනෙකු විශ්‍රාම යාමත් පවත්නා පුරප්පාඩු සඳහා සේවක මණ්ඩලය බඳවා ගැනීම දැඩි ලෙස සීමා කිරීමත් කාර්ය මණ්ඩල හිගය වැඩිවීමට හේතු වූ අතර, ආයතනයේ නිමැවුම්වල ගුණාත්මකභාවයට ද එයින් යම් බලපෑමක් ඇති වූ බව ද සඳහන් කළ යුතුය. පවත්නා සේවක මණ්ඩලයේ දැඩි කැපවීම මත එම තත්ත්වය අවම කර ගනිමින් 2014 වසරේ දී යථෝක්ත ප්‍රගතිය අත්කර ගැනීමට ආයතනයට හැකිවිය.

මගේ අංකය / எனது இல. / My No. } එඩි/අයි/එන්අයිඊ/01/14/09 ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2015 අගෝස්තු 21 දින

අධ්‍යක්ෂ ජනරාල්,

ජාතික අධ්‍යාපන ආයතනය

**ජාතික අධ්‍යාපන ආයතනයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

ජාතික අධ්‍යාපන ආයතනයේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1985 අංක 28 දරන ජාතික අධ්‍යාපන ආයතන පනතේ 19 වන වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(අ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් වෙත 2014 ජුනි 22 දින නිකුත් කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

## 1.3 විගණනයේ වගකීම

මාගේ විගණන මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය නිර්ණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ (3) හා (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට ජාතික අධ්‍යාපන ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 02 ප්‍රකාරව මුදල් ගලායෑම් හා ගලාඒම පිළිබිඹු වන පරිදි මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කල යුතු නමුත් ආයතනය වෙත රාජ්‍ය ප්‍රදාන යටතේ මූල්‍ය නොවන වත්කමක් ලෙස ලැබුණු රු. 8,500,000 ක්වූ වාහනයේ වටිනාකම මුදල් ප්‍රවාහයක් ලෙස සලකා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 09 හි 15 වගන්තිය ප්‍රකාරව තොග පිරිවැය හා ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට ගණනය කල යුතු වූවත් ආයතනයේ අලෙවියට තබා ඇති රු.21,227,878 ක ප්‍රකාශන තොගය තුල රු. 3,537,939 ක ලාභ ආන්තිකයක් ඇතුළත් වීම හේතුවෙන් තොගය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි

### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද ලාභය හෝ අලාභය වර්ෂයේ ලාභයට ගැලපිය යුතු වුවද ආයතනය විසින් ඉකුත් වර්ෂවල ස්ථාවර වත්කම් අපහරණය තුලින් ඇති වූ ලාභාලාභ අපහරණ ලාභ අරමුදලකට ගැලපීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට එහි ශේෂය රු. 3,640,844 ක් වී තිබුණි.

### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට ඇනවුම් නිකුත් කිරීම පමණක් සිදුකර තිබූ රු. 31,569,002 ක්වූ භාණ්ඩවල පිරිවැය උපචිත වියදම් හා මාර්ගස්ථ තොගය යටතේ ගිණුම්ගතකර තිබුණි.

### 2.2.4 නොසැසඳූ පාලන ගිණුම්

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඇතුළත් ස්ථාවර වත්කම් ගිණුම් 04 ක ශේෂ අදාළ උපලේඛන සමඟ සැසඳීමේදී රු.5,390,441 ක වෙනසක් නිරීක්ෂණය විය.

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

ආයතනයේ ණයගැති ශේෂ තුළ වසර 06 කට අධික කාලයක සිට පැවත එන ණය ශේෂ 05 ක එකතුව රු.3,747,754 ක් විය. මේ සඳහා ප්‍රමාණවත් අඩමාණ ණය වෙන් කිරීමක් සිදුකර නොතිබුණි.

## 2.4 නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති, රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 371 | (i) තත්කාර්ය අතුරු අග්‍රිම එය දෙන ලද කාර්යය අවසන් වූ විගසම පියවිය යුතු වුවද ජාතික අධ්‍යාපන ආයතනය විසින් නිලධාරීන් 17 දෙනෙකුට ලබාදී තිබූ එකතුව රු.649,150 ක්වූ තත්කාර්යය අතුරු අග්‍රිම පියවීම මාස 01 සිට මාස 10 දක්වා ප්‍රමාද කර තිබුණි. |
| | | (ii) තත්කාර්ය අතුරු අග්‍රිම ලබාගත හැක්කේ රු. 20,000 ක සීමාව තුළ වුවත් භාණ්ඩාගාර අනුමැතියකින් තොරව ආයතනය විසින් එම සීමාව ඉක්මවා තත්කාර්ය අතුරු අග්‍රිම ලබාදී තිබූ අතර විවිධ වැඩසටහන් 32 ක් සඳහා අග්‍රිම ලබාදීමේදී සියයට 50 සිට සියයට 100 දක්වා වූ අධි ඇස්තමේන්තු මත එකතුව රු.1,178,750 ක අත්තිකාරම් ලබාදී තිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය<br>(I) IV පරිච්ඡේදයේ 3.3 වගන්තිය | ස්ථිර සේවක සංඛ්‍යාවෙහි පුරප්පාඩුවක් ස්ථිර පදනම මත පුරවන තෙක් අනියම් නිලධාරියෙකු එකී තනතුරට බඳවා නොගත යුතු වුවද එයට පටහැනිව හා විධිමත් පරිදි පාලක සභාවේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව ආයතනයේ පුරප්පාඩු සඳහා කැලී පදනම හා කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන සිටි නිලධාරීන් 28 දෙනෙකුගේ සේවය 2013 වර්ෂයේ සිට සේවය ස්ථිර කර තිබුණි. |

| | |
|---|---|
| (ii) IV පරිච්ඡේදයේ 3.3 වගන්තිය | බඳවා ගැනීමේ පටිපාටියට අනුකූලව සේවා පලපුරුද්ද නොතිබෙන අයෙකු 2012 පෙබරවාරි 21 දින පුහුණු පදනම මත සේවයට බඳවා ගෙන පසුව 2013 දෙසැම්බර් 07 දින සිට කොන්ත්‍රාත් පදනමට ආයතනයේ පරිපාලන නිලධාරී ලෙස පත් කර තිබුණි. මාස 09 ක් ගතවීමෙන් පසු තනතුරට අදාල නිතය බඳවා ගැනීම සඳහා පුවත්පත් දැන්වීමක් 2014 සැප්තැම්බර් 02 දින පළකරන ලද අතර තනතුර සඳහා ඉතා ඉහළ සුදුසුකම් සහිත අයදුම්කරුවන්ගෙන් අයදුම්පත්‍ර ලැබී තිබියදීත් විධිමත් බඳවා ගැනීමක් සිදු කිරීම ආයතනය විසින් පැහැර හැර ඇති බව නිරීක්ෂණය විය. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය අවසානයේදී ආයතනයේ මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.59,317,999 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 36,496,150 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.22,821,849 ක වාසිදායක තත්ත්වයක් පෙන්නුම් කරන අතර මෙම විචලනයට දේශීය නැන්පතු ආදායම් රු.117,128,348 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 3.2 ආයතනය විසින් හා ආයතනයට එරෙහිව ආරම්භ කර ඇති නෛතික සිද්ධි

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය විසින් අධ්‍යයන කටයුතු සඳහා විදේශ ගතව ගිවිසුම් කඩ කරන ලද නිලධාරීන් 06 දෙනෙකුට එරෙහිව එකතුව රු.12,215,387 ක් වන්දි ඉල්ලා අධිකරණ වල නඩු 06 ක් ගොනුකර තිබුණු අතර ඉන් එක් නඩු තීන්දුවකට පසුව රු.14,604 බැගින් වටිනාකම රු.876,236 ක් වාරික 60 කින් ගෙවා අවසන් කිරීමට නියෝග කර තිබුණි.

(ආ) විනය විරෝධී හැසිරීම් මත සේවයෙන් පහ කර තිබූ පුද්ගලයින් 04 දෙනෙකු විසින් ගුරු පුහුණු සහතික ලබා ගැනීම සම්බන්ධයෙන් ආයතනයට එරෙහිව අධිකරණ වල නඩු 04 ක් ගොනුකර තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) ජාතික අධ්‍යාපන ආයතනය පිහිටා තිබූ රජය සතු රු.78,600,000 ක් වටිනා හෙක්ටයාර් 7.0958 ක් වූ කැන්නකැලේවත්ත ඉඩම හා මීපේ ගුරු පුහුණු මධ්‍යස්ථානය පිහිටා තිබූ රු.65,000,000 ක් වටිනා බදුවත්ත (කහවණේන) ඉඩම විධිමත් ලෙස ආයතනය වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) වැසිකිලි පද්ධතියක් ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු සකස් කිරීම වෙනුවෙන් උපදේශක සමාගමක් සමග ගිවිසුම්ගතව, උපදේශක ගාස්තු ලෙස රු.1,200,949 ක් ගෙවා වසර 7ක් ගතවී ඇතත් ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණි. මෙම ගෙවීම ගිණුම් වලින් කපාහැරීමට ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීම් කර තිබුණි.

### 4.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2013 වර්ෂයේදී ආසියානු සංවර්ධන බැංකු ආධාර යටතේ 6 ශ්‍රේණියේ සිට 10 ශ්‍රේණිය දක්වා පාසල් විෂය ධාරාවට අනුකූල වන පරිදි ගුරුභවතුන් සඳහා ඇගැයීම් උපකරණ ලෙස ග්‍රන්ථ 124,000 ක් මුද්‍රණය කර තිබුණද විගණිත දිනය වූ 2014 දෙසැම්බර් 15 දින වන විටත් විෂයයන් 27 කට අදාල රු.5,873,491 ක් වටිනා ග්‍රන්ථ 81,416 ක් ගුරුභවතුන් අතර බෙදාහැරීමට කටයුතු කර නොතිබිණි.

(ආ) 2009 ඔක්තෝබර් මාසයේදී 6 වන ශ්‍රේණිය සඳහා මුද්‍රණය කරන ලද විෂයයන් 18 කට අදාල ගුරු මාර්ගෝපදේශ 43,979 කින් වටිනාකම රු.6,591,677 ක් වටිනා ගුරු මාර්ගෝපදේශ 36,308 ක් එනම් සියයට 82 ක ප්‍රමාණයක් අවුරුදු 04 ක කාලයක සිට ගුරුවරුන් වෙත බෙදා හැරීමට හෝ අලෙවි කොරව කිරීමට කටයුතු නොකර ගබඩා ගත කර තිබුණි. 2015 වර්ෂයේ සිට 6 ශ්‍රේණියේ විෂය නිර්දේශ සංශෝධනය කිරීම හේතුවෙන් මෙම පොත් භාවිතයට ගැනීමක් සිදු නොකෙරෙන බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඇ) ආයතනයේ අවශ්‍යතාවය අනුව පූර්ව ඉල්ලීමකින් තොරව අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ වාචික උපදෙස් මත හදිසි අත්‍යවශ්‍ය මිලදී ගැනීමක් ලෙස සඳහන් කරමින් සැපයුම් ප්‍රසම්පාදනය සටහන් සමාලෝචිත වර්ෂයේ සැප්තැම්බර් මාසයේදී රු.2,195,200 ක් වැය කර දේශන ශාලා පුටු 400 ක් මිලදී ගෙන විවිධ අංශවලට බෙදාහැර ඇතත් නිසි උපයෝජනයට යොදා ගෙන නොතිබුණි.

## 4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

---

දැනුම කේන්ද්‍රයේහි සඳහම ලෙස පාසල් අධ්‍යාපන පද්ධතිය ප්‍රතිනිර්මාණය කිරීමේ ව්‍යාපෘති අරමුදල් (TESP) උපයෝගී කරගෙන එහි අරමුණුවලට පටහැනි පහත සඳහන් කාර්යයන් වෙනුවෙන් වැයකර තිබුණි.

(අ) මුදල් අයකර පවත්වනු ලබන විවිධ උපාධි පාඨමාලා සඳහා පිරිනමනු ලබන සහතික පත්‍ර බහාලුම් 8000 ක් මිලදී ගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේ සැප්තැම්බර් මාසයේදී රු.1,315,130 ක් වැය කිරීම.

(ආ) විදුහල්පතිවරු පුහුණු කිරීමේ වැඩසටහනකදී බෙදා හැරීම සඳහා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසයේදී Pen drive 1000 ක් මිලදී ගැනීම සඳහා රු.703,800 ක් වැය කිරීම.

### 4.4 අරමුදල් ලාභ උපයෝජනය

පර්යේෂණ හා සංවර්ධන කටයුතු සඳහා 2011 වර්ෂයේ රු. 8,750,000 ක අරමුදලක් වෙන්කර තිබුනද 2015 මාර්තු 31 දින දක්වාම කිසිදු පර්යේෂණ ක්‍රියාවක් සඳහා අරමුදල් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

### 4.5 හඳුනා ගන්නා ලද පාඩු

ජාතික අධ්‍යාපන ආයතනය විසින් පවත්වනු ලබන සියළුම විභාග සහතික පත්‍ර සඳහා පොදු සහතිකයක් මුද්‍රණය කිරීම සඳහා මුද්‍රණාලය වෙත ලබාදී තිබූ ඇණවුම අනුව මුද්‍රණය කරන ලද දෝෂ සහිත ආදර්ශකය නිවැරදි බවට ආයතනයේ අධ්‍යක්ෂවරයෙකුගේ අනුමැතිය මත සහතික පත්‍ර 1450 ක් මුද්‍රණය වෙනුවෙන් රු.85,112 ක් වැයකර තිබුණි.

### 4.6 කාර්ය මණ්ඩල පරිපාලනය

2014 දෙසැම්බර් 31 දිනට ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 652 ක්ද තථ්‍ය සේවක සංඛ්‍යාව 462 ක්ද වීමෙන් සේවක පුරප්පාඩු 190 ක් විය. එක් එක් දෙපාර්තමේන්තු සඳහා කාර්යය මණ්ඩල අවශ්‍යතාවය අනුව අවශ්‍ය නිලධාරීන් සංඛ්‍යාව අනුමත කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 5.1 අයවැය ලේඛනමය පාලනය

ආයතනයේ සංශෝධිත අයවැය ලේඛනය ගිණුම් වර්ෂය ඉකුත් වී මාස 04 ක් ගතවීමෙන් පසුව අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතියට යටත්ව විගණනය වෙත ඉදිරිපත් කරන ලද්දේ 2015 මැයි 08 දිනදිය. සංශෝධිත අයවැය ගත වියදම් තථ්‍ය වියදම්, සමඟ සැසඳීමේදී සියයට 24 සිට සියයට 101 දක්වා විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

## 5.2 නොවිසඳී ඇති විගණන ඡේද

විගණන නියැදි පරීක්ෂාවේදී 2009 ජුනි 01 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 (I) හා 30(II) ප්‍රකාරව ආයතනයේ මාණ්ඩලික ශ්‍රේණි හැර අනෙකුත් නිලධාරීන්ගේ වැටුප් පරිවර්තනය කිරීමේදී නිලධාරීන් 29 දෙනෙකු සඳහා 2009 ජනවාරි 01 සිට 2014 අප්‍රේල් 30 දක්වා රු.1,209,220 ක වැටුපක් වැඩිපුර ගෙවා තිබූ අතර ඒ මත රු.156,684 ක සේවක අර්ථ සාධක මුදල් ප්‍රේෂණය කර තිබූ බව ඉකුත් වර්ෂයේ වාර්තාවෙන් පෙන්වාදී තිබුනද එය 2015 ජුනි 22 දින වනවිටත් නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් වෙත දන්වා යවන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) සේවක මණ්ඩල කළමනාකරණය

(ආ) අධ්‍යාපන ප්‍රකාශන බෙදාහැරීම

(ඇ) වත්කම් කළමනාකරණය

(ඈ) ගිණුම්කරණය

(ඉ) ප්‍රසම්පාදන ක්‍රියාවලිය

(ඊ) තොග පාලනය

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න

විගණකාධිපති (වැඩබලන)

**ජාතික අධ්‍යාපන ආයතනයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරණ මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

**පැහැදිලි කිරීම් :**

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

(අ) පිළිගනිමි.
2015 වසරේ ගිණුම් පිළියෙල කිරීමේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි.

(ආ) උක්ත ගැලපීම 2015 මූල්‍ය වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ ආරම්භක ශේෂ ප්‍රතිෂ්ඨාපනය කිරීම තුළින් ගැලපීමට කටයුතු කරනු ලැබේ.

2.2.2 **ගිණුම්කරණ ප්‍රතිපත්ති**

පිළිගනිමි.

මේ සඳහා අනුමැතිය ලබා ගෙන 2015 වර්ෂයේ ගිණුම්වලින් ගැලපීම් සිදු කිරීමට කටයුතු කරනු ලැබේ.

2.2.3 **ගිණුම්කරණ අඩුපාඩු**

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම් ආකෘතික රාමුව අනුව උපචිත පදනමින් මූල්‍ය වාර්තා පිළියෙල කළ යුතු අතර, ඒ අනුව ගිණුම් වර්ෂය අවසන් වන දිනට ආයතනයේ ඇති කර ගත් බැඳීම් ද ගිණුම්ගත කළ යුතුය. ඒ අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත.

2.2.4 **නොසැසඳු පාලන ගිණුම්**

**යන්ත්‍රෝපකරණ**

පාලන ගිණුම්වල උපලේඛනයන් අතරින් යන්ත්‍රෝපකරණ උපලේඛනයන් පෙර ගිණුම් වර්ෂ ශේෂ සමග සැසඳෙන අතර ඒවාට අදාළ උපලේඛන රජයේ විගණන අංශය වෙත දැනටමත් ඉදිරිපත් කර ඇත.

**ෆොටෝ කොපි යන්ත්‍ර හා ලී බඩු**

ඡායා පිටපත් යන්ත්‍ර සහ ලී බඩු යන උපලේඛනවල 2014 වර්ෂය තුළ ඉවත් කරන ලද වත්කම් ඇතුළත් වී ඇති අතර එහි බලපෑම ඉවත් කළ විට එම උපලේඛන ද ලෙජර් ගිණුම් ශේෂ හා සැසදේ.

**පරිගණක හා උපාංග**

මෙම සැසඳීම සඳහා යොදා ගෙන ඇත්තේ පරිගණක ගත කරන ලද වත්කම් උපලේඛන වේ. නමුත් "පරිගණක හා උපාංග" සඳහා පවත්වාගෙන යන පරිගණකගත උපලේඛන යාවත්කාලීන කර නොමැති නමුත් ඒ සඳහා පවත්වා ගෙන යන වර්ෂයන්ගේ නව වත්කම් මිල දී ගැනීමේ ලේඛනවල එකතුව සමග ලෙජර් ගිණුම් සැසදේ.

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

ණයගැති කාල විශ්ලේෂණයේ දී වසර පහකට වඩා වැඩි ණයගැති ශේෂවල එකතුව රුපියල් මිලියන 3,769,923 ක් බව තහවුරු වූ අතර එහි විශ්ලේෂණයන් පහත දැක්වේ.

| | | |
|---|---|---|
| 1. | අධ්‍යාපන අමාත්‍යාංශය | 3,237,799.66 |
| 2. | බී. ආර්. එම්. දයානන්ද | 124,889.90 |
| 3. | ජාතික කඩදාසි සංස්ථාව | 318,500.00 |
| 4. | එස්. සමරවීර | 28,302.00 |
| 5. | බී. කේ. විජේගුණවර්ධන | 60,432.00 |

ඉහත අංක 1. අලාභයක් ලෙස ලියා හැරීම සඳහා අනුමැතිය ලබා ගැනීමට මහා භාණ්ඩාගාරයට යොමු කළ අතර ඔවුන් විසින් ආයතනයේ සභාවේ අනුමැතිය ලබා ගෙන අලාභයක් ලෙස ලියාහැරීම සඳහා උපදෙස් ලබා දුන් අතර මෙම වර්ෂයේ ආයතනයේ සභාව පත් කිරීම ප්‍රමාද වූ බැවින් අවශ්‍ය අනුමැතිය ලබා ගෙන 2015 වර්ෂයේ ගිණුම් තුළින් ගැලපීම සිදු කරනු ලැබේ.

ඉතිරි ණයගැති ශේෂ ආයතනයේ විවිධ අංශවල මෙහෙයුම් හේතුවෙන් පැන නැගුන ණයගැති ශේෂ බැවින් එම අංශවලින් තහවුරු කිරීම් සහ නීති අංශයෙන් උපදෙස් ලබා ගෙන 2015 වර්ෂයේ දී සුදුසු ක්‍රියාමාර්ගයන් අනුගමනය කරනු ලැබේ.

## 2.4 නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

**(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 371**

(i) ලබා ගත් අත්තිකාරම් මුදලින් ඉතිරි මුදල් අප්‍රමාද ව අදාළ නිලධාරීන් විසින් තැන්පත් කර ඇති අතර, අත්තිකාරම නිරවුල් කිරීමට අවශ්‍ය ලේඛන ඉදිරිපත් කිරීමේ ප්‍රමාදයක් සිදු වී ඇත. අත්තිකාරම් පියවීමේ ප්‍රමාදයන් ඇති වන්නේ ගිණුම් අංශයේ සේවකයන්ගේ හිඟකමක් පවතින නිසාත් අත්තිකාරම් ලබා ගත් නිලධාරීන් විසින් පියවීම් ලේඛන නිසි කලට ඉදිරිපත් නොකිරීමේ හේතුව නිසාත් ය. මේ අනුව අත්තිකාරම් නිරවුල් කිරීමට අදාළ ලේඛන වහාම මුදල් අංශයට ඉදිරිපත් කිරීමට වග බලා ගන්නා ලෙස අදාළ නිලධාරීන්ට උපදෙස් ලබාදී ඇත.

ත්‍රෛමාසික ගිණුම් රැස්වීම් පවත්වා ඉන්පසුව ප්‍රගතිය පාලනයට යටත් කරනු ඇත.

විගණන වාර්තාවේ දක්වා ඇති 2014 දෙසැම්බර් 31 දිනට පියවා නොතිබූ අත්තිකාරම් 17ට අදාළ විස්තර උපලේඛන අංක 01 මගින් ඉදිරිපත් කර ඇත.

(ii) වාර්ෂික සැලැස්මට අනුව එක් එක් දෙපාර්තමේන්තු මගින් සංවිධානය කරනු ලබන අනුමත වැඩමුළු ඇස්තමේන්තුවල සඳහන් සම්පත් පුද්ගලයින්ට හා සහභාගිවන්නන් සඳහා ගෙවිය යුතු මුදල් වෙනුවෙන් අදාළ නිලධාරීන්ට අත්තිකාරම් ලබාදීම සිදුකර ඇත.

මුදල් රෙගුලාසි 371 තත් කාර්ය අතුරු අග්‍රිම සීමාව අනුව එක් නිලධාරියකුට ලබා දිය හැක්කේ රු. 20,000/- අත්තිකාරම් මුදලක් පමණි. ඒ අනුව ඇස්තමේන්තු මුදල රු. 20,000/- ට වඩා වැඩි වන අවස්ථාවල දී නිලධාරීන් කිහිප දෙනෙකුට අත්තිකාරම් ලබාදීමට සිදු වේ. විගණන විමසුමේ සඳහන්ව ඇත්තේ බොහෝ අවස්ථාවල අත්තිකාරම් සීමාව මත එක් වැඩමුළුවක් සඳහා නිලධාරීන් කිහිප දෙනෙකු විසින් ලබා ගත් අත්තිකාරම්වලින් වැඩමුළු සඳහා සහභාගි නොවූ තැනැත්තන්ට අදාළ ඉතිරි මුදල් තැන්පත් කර ඇති අවස්ථා බව පෙන්වා දෙනු කැමැත්තෙමි.

ඇතැම් අවස්ථාවල දි ඇස්තමේන්තුවලට නම් ඇතුළත් කර තිබූ සම්පත් පුද්ගලයන් හා සහභාගිවන්නන් නොවැළැක්විය හැකි හේතූන් නිසා වැඩමුළුවට සහභාගි නොවන අවස්ථා ඇත. එවැනි අවස්ථාවල ලබාගත් අත්තිකාරම් මුදල් ඉතිරිවන අතර එම මුදල ජාතික අධ්‍යාපන ආයතනයේ ගිණුමක තැන්පත් කරනු ලැබේ. ලබා ගත් අත්තිකාරම් මුදලක ඉතිරි වූ මුදලක් වේ නම් වැඩමුළුව නිමවූ දිනට පසු දිනම ජාතික අධ්‍යාපන ආයතනයේ තැන්පත් කළ යුතුව ඇත. ප්‍රමාදවන කාලය සඳහා මසකට 4% ක දඩ මුදලක් අය කරනු ලැබේ. මෙමගින් අත්තිකාරම් ක්‍රියාවලිය පාලනය කර ඇත.

විගණන වාර්තාවේ සඳහන් ලබා දී තිබූ අත්තිකාරම් මුදල්වලට අදාළ විස්තර උපලේඛන අංක 02 මගින් ඉදිරිපත් කර ඇත.

**(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය**

(i) **iv පරිච්ඡේදයේ 3.3 වගන්තිය**

අනුමත බඳවා ගැනීමේ පටිපාටිය අනුව අධ්‍යක්ෂ තනතුර දක්වා බඳවා ගැනීමේ අධිකාරි බලය පවතිනුයේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට ය. එම අධිකාරි බලය යටතේ හදිසි හා අත්‍යවශ්‍ය සේවා සඳහා මෙම බඳවා ගැනීම සිදු කර ඇත. ඉදිරියේ දී අභ්‍යන්තර හා බාහිර අයදුම්පත් කැඳවීම මඟින් විධිමත් පරිදි පුරප්පාඩු පිරවීමට කටයුතු කරනු ලැබේ.

ඉදිරියේ දී බඳවා ගැනීමේ පරිපාටියට අනුව කටයුතු කරනු ලැබේ.

(ii) **ආයතන සංග්‍රහයේ iv පරිච්ඡේදයේ 3.3 වගන්තිය**

2013. 12. 07 දින සිට ඇති වූ පරිපාලන නිලධාරි තනතුර සඳහා ආයතනයේ සභාවේ අනුමැතිය මත 2013. 12. 07 දින සිට එම තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත නිලධාරියකු බඳවා ගෙන ඇතත් මේ වන විට ඔහුගේ කොන්ත්‍රාත් සේවා කාලය 2015. 06. 23 දිනැති ලිපිය මඟින් අවසන් කර ඇත. (ඇමුණුම 01)

දැනට පරිපාලන නිලධාරි තනතුර සඳහා අභ්‍යන්තර උසස්වීමක් මඟින් නිලධාරියකු පත් කර ඇත.

## 3. මුල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

පිළිගනිමි.

### 3.2 ආයතනය විසින් හා ආයතනයට එරෙහිව ආරම්භ කර ඇති නෛතික සිද්ධි

**(අ) ආයතනය විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි**

1. **කේ.ඇන්ටන් රවීන්ද්‍ර කුමාර් මයා**

ඉහත නම් සඳහන් නිලධාරියා විදේශ ගත වීමේදී එළඹුනු ගිවිසුම කඩ කිරීම නිසා නුගේගොඩ දිසා අධිකරණය හමුවේ අංක 780/9/M නඩුව පවරා තිබුණි. මෙම නඩුවේ අභ්‍යාසලාභියා වන ප්‍රධාන විත්තිකරු පදිංචි ලිපිනය සොයා ගත නොහැකි වූ බැවින් ඔහුගේ ඇපකරු වන නඩුවේ 2වන විත්තිකාරිය වන එස්.එම්.කාසිම් මියගෙන් එකී මුදල වන රු. 2,237,337.05 මුදල ලබා ගැනීම සඳහා ඒක පාර්ශ්වික නඩු තීන්දුවක් ලබා දී ඇත.

මෙම අභ්‍යාසලාභියා දැනට විදේශගත වී ඇති අතර ඔහු හා ඔහුගේ එක් ඇපකරුවකු විදේශගතවීම නිසා සොයා ගත නොහැකි වී ඇත. දෙවන විත්තිකරුට එරෙහිව ඒකපාර්ශවික තීන්දුවක් 2013.03.21 දින ලබා දී ඇත. නීතිපති දෙපාර්තමේන්තුව විසින් එම තීන්දුවට අනුව තීන්දු ප්‍රකාශය සකස් කර දෙවන විත්තිකරු වෙත යොමු කිරීම සඳහා දිසා අධිකරණය වෙත යොමු කර ඇත. ඒ අනුව ඉදිරි කටයුතු සිදු කර ඇත.

**වර්තමාන තත්ත්වය :**

**මෙම නඩුවේ 2 වන විත්තිකාරියට එරෙහිව ලබා දී තිබූ ඒක පාර්ශ්වික තීන්දු ප්‍රකාශය අධිකරණයේ පිස්කල් මගින් යොමු කලත් ඇය එම ලිපිනය අතහැර ගොස් ඇති බැවින් එය ලබාදීමට නොහැකි වී ඇත. දෙවන විත්තිකාරියගේ වර්තමාන ලිපිනය දැන ගැනීම සඳහා වත්තල පොලිසියට හා ප්‍රාදේශීය ලේකම් වෙත දැනුම් දීමක් කර ඇත.**

2. **එස්.ඒ.එම්.එස්.එන්.සෙනෙවිරත්න මිය**

මෙම නිලධාරිනියට එරෙහිව ගල්කිස්ස දිසා අධිකරණය හමුවේ අංක 4801/05/M නඩුව පවරා ඇත. මෙම නඩුවේ විත්තිකරු හා ඇපකරුවන් දෙදෙනා සියරට අතහැර දමා ගොස් ඇත. ඔවුන් සොයා ගැනීමට මෙරට අදාළ ප්‍රදේශයේ පොලිසිය හා ප්‍රාදේශීය ලේකම් වෙත දැනුම් දී ඇති අතර, එකී ලිපිනයන්වල ඔවුන්ගේ පදිංචිය සොයා ගත නොහැකි බවට වාර්තා කර ඇත. ඔවුන් දැනට විදේශයේ පදිංචිව ඇතැයි කියනු ලබන ලිපිනය සොයා ගැනීමට ඇමරිකාවේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයට දැනුම් දී ඇතත් එය සොයා ගැනීමට නොහැකි වී ඇත.

මෙම අභ්‍යාසලාභියා සහ අදාළ ඇපකරුවන් දෙදෙනා ද විදේශගත වී ඇති බැවින් ඔවුන් සියලු දෙනාට අධිකරණය මගින් සිතාසි භාරදීමට නොහැකි වී ඇති බව අධිකරණයට පිස්කල් වාර්තා කර ඇත.

**වර්තමාන තත්ත්වය :**

**මෙම නඩුවේ 1, 2 හා 3 විත්තිකරුවන් පදිංචි ලිපිනයන්හි නොමැති බැවින් සිතාසි භාර දීමට නොහැකි වී ඇත. එම නිසා නඩුව තාවකාලිකව බහා තබා ඇත.**

3. **ඒ.පී.එස්.එස්.පතිරණ මිය - 7018/M දිසා අධිකරණය, ගල්කිස්ස**

මෙම නඩුව දැනට ගල්කිස්ස දිසා අධිකරණය හමුවේ විභාග වෙමින් පවතී.

ජාතික අධ්‍යාපන ආයතනයට 2000 වර්ෂයේ නව අධ්‍යයන කාර්ය මණ්ඩලයට පිළිගත් විශ්ව විද්‍යාලයක ශ්‍රේණිගත උපාධිධාරීන් බඳවා ගෙන ඔවුන්ට ලෝක බැංකු ආධාර මත GEP 2 ව්‍යාපෘතිය යටතේ විෂයමාලා සංවර්ධනය පිළිබඳ ශාස්ත්‍රපති අධ්‍යයන පාඨමාලාව හැදෑරීම සඳහා විදේශ ශිෂ්‍යත්ව පිරිනමා ඉන්පසු ඔවුන් ආයතනයේ කාර්ය මණ්ඩලයේ සේවා නියුක්ත කිරීමේ එකඟතාවය මත බඳවා ගෙන ඇත. ඒ අනුව මෙම නවක කාර්ය මණ්ඩලය සේවයට බඳවා ගැනීමෙන් පසු එම එකඟතාවය අනුව එම නිලධාරීන්ට ඉතා කෙටි කාලයක් තුළ විදේශ ශිෂ්‍යත්ව පිරිනමා ඇත.

මෙම නඩුව විභාගයට ගෙන ඇත.

**වර්තමාන තත්ත්වය :**

මෙම න ‹ව දැනට විභාග වෙමින් පවතී. මීළඟ නඩු දිනය 2015. 10. 21 දින වේ.

**4. බී.කේ. විජේගුණවර්ධන මෙනවිය**

මෙම ශිෂ්‍යත්වලාභියා විදේශ ගත වීමේ දී එළඹී ගිවිසුම අනුව නැවත සිය රටට පැමිණ බැඳුම්කර කාල සීමාව තුළ සේවය නොකිරීම නිසා ඇයට එරෙහිව නඩු පැවරීමට නීතිපති දෙපාර්තමේන්තුව මඟින් කටයුතු කර ඇති අතර මෙම නිලධාරිණියට 2013.11.15 දින නීතිපති මඟින් රු. 1,335,285.99 මුදල අයකර ගැනීම සඳහා එන්තරවාසි නිකුත් කර ඇත.

**වර්තමාන තත්ත්වය :**

පැමිණිල්ල කෙටුම්පත් කර ඇත.

**5. කේ. ඩබ්ලිව්. පී. ඒ. වීරවර්ධන මිය**

මෙම නිලධාරිනියගෙන් මුදල් අයකර ගැනීම සඳහා 2013.06.05 දින එන්තරවාසි නිකුත් කර ඇත.

**වර්තමාන තත්ත්වය :**

පැමිණිල්ල කෙටුම්පත් කර ඇත.

**6. එස්.එම්.එම්. සේනානායක මයා**

මෙම නිලධාරියාට එරෙහිව නුගේගොඩ දිසා අධිකරණය හමුවේ අංක 669/08/M නඩුව පවරා තිබුණි.

මෙම නඩුව 2013.08.06 දින කැඳවූ අවස්ථාවේ දී මෙම නිලධාරියා එම මුදල වසර 05 ඇතුළත (වාරික 60 කින්) ගෙවා පියවන බවට අධිකරණය හමුවේ සමථයක් සඳහා යෝජනා කරන ලදි. kvqj wjika න we;'

ඒ අනුව 2013.10.30 දින පැවති එකඟතාවය පරිදි එස්. එම්. සේනානායක මහතා විසින් 2013.12.18 දින සිට 2015.10. 09 දින දක්වා රු. 335,890/39 ක මුදලක් ආයතනය වෙත ගෙවා ඇත' (රු. 14,603/93 x වාරික 23) එහි මුල් වාරිකය හා අවසන් වාරිකය සඳහා ගෙවා ඇති ලදුපත්වල පිටපත් අමුණා ඇත. (ඇමුණුම 02)

## (ආ) ආයතනයට එරෙහිව ආරම්භ කර ඇති නෛතික සිද්ධි

**කම්කරු විනිශ්චය සභාව - බී. ආර්. එම්. දයානන්ද**

මොහු විසින් සිදුකර ඇති රු. 36,000/= මූල්‍ය වංචාවක් සම්බන්ධයෙන් විධිමත් විනය පරීක්ෂණයක් පවත්වා ඒ අනුව වැරදිකරු වීම මත සේවයෙන් පහකර ඇත.

මොහු අංක : MH/33/208/04 දරන නඩුව ආයතනයට එරෙහිව පවරා ඇත.

**වර්තමාන තත්ත්වය :**

**මෙම නඩුව අවසන් වී ඇත. එහි තීන්දු ප්‍රකාශය 2015/09/29 දින ලබාදීමට නියමිතව තිබුණ ද එය 2015/10/29 දිනට කල් තබා ඇත.**

**නිල්මිණි වික්‍රමසිංහ**

ජාතික අධ්‍යාපන ආයතනයේ පොත් හලේ දෛනික විකුණුම්වලින් 2009 වර්ෂය තුළ රු. 549,772.50 ක මුදලක් පෞද්ගලික පරිහරණය සඳහා යොදා ගැනීම සම්බන්ධයෙන් විධිමත් විනය පරීක්ෂණයක් පවත්වා එහි තීරණය මත වරදකරු වූයෙන් සේවයෙන් පහකර ඇත.

ඇය අංක MH33/1005/11 දරන නඩුව ආයතනයට එරෙහිව පවරා ඇත. දැනට මෙම නඩුව විභාග වෙමින් පවතී.

**වර්තමාන තත්ත්වය :**

**දැනට විභාග වෙමින් පවතී. අවසන් සාක්ෂිකරුගෙන් සාක්ෂි විමසීම කරනු ඇත.**

**එම්.කේ. ඩී. දේශප්‍රිය**

**MH33/1179/14 - කම්කරු විනිශ්චය සභාව**

**වර්තමාන තත්ත්වය :**

**මේ පිළිබඳව සමථයක් මගින් ආයතනයේ පාලක සභාවේ අනුමැතිය මත 2015/08/04 දින සිට මොහු නැවත සේවයේ පිහිටුවා ඇත. හිඟ වැටුප් ද ගෙවා ඇත.** (ඇමුණුම 03)

**WP/HCCA/MT/12/2012 RA - සිවිල් මහාධිකරණය, ගල්කිස්ස : කේ.ඩී.එල්.රානි මිය**

ජාතික අධ්‍යාපන ආයතනය මඟින් මෙහෙයවන ලද දූරස්ථ ගුරු පුහුණු පාඨමාලා නිසි පරිදි සම්පූර්ණ කර නොමැති හෙයින් පාඨමාලා සහතිකයට හිමිකම් නොලැබූ බැවින් එය ලබා ගැනීම සඳහා ආයතනයට එරෙහිව අභියාචනාධිකරණය හමුවේ අංක 11/2007 දරන නඩුව පැවරූ අතර එහි ඇයගේ පෙත්සම නිශ්ප්‍රභා කෙරින. නැවත ඇය එම කාරණය නුගේගොඩ දිසා අධිකරණය හමුවේ අංක SPL/125/09 දරන නඩුව පැවරූ අතර එම නඩුව ද නිශ්ප්‍රභා කෙරිණ.

ඇය නැවත මේ පිළිබඳව ගල්කිස්ස සිවිල් අභියාචන මහාධිකරණය හමුවේ ඉහත අංක යටතේ නඩුව පවරා ඇත.

**වර්තමාන තත්ත්වය :**

මෙම නඩුව 2015. 09. 21 දින කැඳවනු ලැබීය. මී ළඟ කැඳවීම් දිනය 2016. 01. 19 දින වේ.

මේ පිළිබඳව පරික්ෂා කොට වාර්තාවක් ඉදිරිපත් කිරීම ගැන නීතිඥ සමිත් කරුණානායක මහතා වෙත යොමු කර ඇත.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

(අ) කලින් ගුරු විදුහල සහ ජාතික අධ්‍යාපන ආයතනය එකම භූමියේ තිබූ අතර ජාතික අධ්‍යාපන ආයතනයේ ප්‍රධාන කාර්යාලය පිහිටි ඉඩම, පසුකාලීනව පිඹුරක් සකස් කර ජාතික අධ්‍යාපන ආයතනයට අයත් ගොඩනැගිලි සහ භූමිය අධ්‍යාපන ලේකම්ගේ අංක : 2/ඉඩ/2/බප/1/1416/97 හා 2001. 08. 13 දිනැති ලිපිය මඟින් පවරා ඇත. මේ සඳහා ඔප්පු කිසිවක් නොමැත.

මීපේ (කලින් සෞන්දර්ය අධ්‍යාපන ආයතනය) ඉඩම, ආයතනය ආරම්භ කල කාලසීමාවේ සිටම ජාතික අධ්‍යාපන ආයතනය විසින් පරිහරණය කර ඇත. මෙම ඉඩම් පිළිබඳ පිඹුරුපත් හැර ඔප්පු කිසිවක් ජාතික අධ්‍යාපන ආයතනය සතුව නොමැත.

මෙම ඉඩම්වල විධිමත් අයිතිය තහවුරු කිරීම සඳහා අවශ්‍ය ලිපි ලේඛන සකස් කිරීමට පියවර ගන්නා ලෙස අදාළ නිලධාරීන් වෙත උපදෙස් ලබා දී ඇත.ඒ අනුව මෙම ඉඩම් හා ගොඩනැගිලි ජාතික අධ්‍යාපන ආයතනය වෙත නිසි පරිදි පවරා දීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස අධ්‍යාපන ලේකම් වෙත 2015.07.16 දින දැනුම් දී ඇත. (ඇමුණුම 04) ඒ අනුව අවශ්‍ය ඉදිරි කටයුතු කරනු ලැබේ.

(ආ) මෙම කාර්යය ඉටු නොවීමට හේතු වී ඇත්තේ අවශ්‍ය ප්‍රතිපාදන නොලැබීම හේතුවෙනි. වැසිකිලි පද්ධතිය ඉදිකිරීමේ අවශ්‍යතාවය තවදුරටත් පවතින හෙයින් සහ උපදේශක ගාස්තු වශයෙන් ගෙවන ලද රු. 1,200,949/ ක මුදල අපතේ යාම වළක්වාලීම යන හේතුන් මත මෙම ඉදිකිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන මහා භාණ්ඩාගාරය වෙතින් ලබා ගෙන ඉදිරි කටයුතු කිරීමට තීරණය විය.

## 4.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

(අ) 2015 වර්ෂයේ දී 6 සහ 10 ශ්‍රේණි සඳහා හඳුන්වා දෙනු ලැබූ විචාරවත් විෂයමාලාව යටතේ වූ පාසල් විෂය නිර්දේශවල යම් යම් සංශෝධන සිදු වුව ද පාසල් පාදක ඇගයීම් උපකරණයක් ලෙස 6, 7, 8, 9 ශ්‍රේණි සඳහා සකස් කර ඇති මෙම පොත් නව විෂයමාලාව යටතේ ද කිසිදු වෙනසක් නොමැතිව භාවිත කළ හැකිය.

විගණිත වාර්තාවේ සඳහන් කර ඇති ඇගයීම් උපකරණයක් ලෙස මුද්‍රණය කරන ලද ග්‍රන්ථවලින් ගබඩාවේ ඉතිරි වී ඇති පොත් සියල්ල පළාත් 09 අතරේ බෙදා හැරීමට අවශ්‍ය කටයුතු සංවිධානය කර ඇත. ඒ අනුව උතුරු මැද, වයඹ, ඌව, සබරගමුව, උතුර, නැගෙනහිර, මධ්‍යම සහ දකුණු පළාත් වෙත මෙම පොත් බෙදා හැරීමට අවශ්‍ය කටයුතු සිදු කර ඇත.

බස්නාහිර, පළාත සඳහා ඉදිරි දිනවල දී මෙම පොත් බෙදා හැරීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ඇත.

(ආ) විගණිත වාර්තාවේ සඳහන් පොත් අතීතයේ දී මුද්‍රණය කරන ලද පොත් වුව ද එහි අන්තර්ගතය වර්තමානයට ද ගැලපෙන බැවින් අතිරේක කියවීම් පොතක් ලෙස මේවා ප්‍රයෝජනයට ගත හැකි තත්වයේ පවතින බැවින් මෙම පොත් පළාත් 09 හි පාසල් පුස්තකාලවල භාවිතය සඳහා බෙදා හැරීමට අවශ්‍ය කටයුතු සංවිධානය කර ඇත. ඒ අනුව උතුරු මැද, වයඹ, ඌව, සබරගමුව, උතුර සහ නැගෙනහිර, මධ්‍යම සහ දකුණු පළාත් වෙත මෙම පොත් බෙදා හැර ඇත.

බස්නාහිර පළාත සඳහා ඉදිරි දිනවල දී මෙම පොත් බෙදා හැරීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ඇත.

(ඇ) ජාතික අධ්‍යාපන ආයතනයේ විවිධ අංශ වෙනුවෙන් වූ දේශනශාලා සඳහා පුටු අවශ්‍යව තිබූ අතර ඇතැම් දේශන ශාලාවල තිබූ පුටු දීර්ඝ කාලයක් භාවිත කර ඇති බැවින් 2014/06/18 දින අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබා ගෙන මෙම පුටු 400 මිල දී ගැනීමේ ප්‍රසම්පාදන කටයුත්ත ආරම්භ කර ඇත.

ජාතික අධ්‍යාපන ආයතනය මඟින් ගුරුවරුන් හා අධ්‍යාපන ක්ෂේත්‍රයට සම්බන්ධ විවිධ නිලධාරීන් සඳහා විවිධ පාඨමාලා හා පුහුණු වැඩමුළු පවත්වනු ලබන අතර මෙම වැඩ සටහන් සඳහා සහභාගිවන්නන්ට අත්‍යවශ්‍ය වූ දේශනශාලා පුටු 400 ක් මිල දී ගෙන සැපයිය යුතු වූ බැවින් ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදු කිරීමට කාලය ගත වන බැවින් ප්‍රසම්පාදන අත්පොත සඳහා වූ අතිරේකය 20 ප්‍රකාරව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.5.1 ට අනුව රාජ්‍ය ආයතනයක් වන සී/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව වෙතින් තාක්ෂණ ඇගයීම් කමිටු නිර්දේශ සහ ප්‍රධාන ප්‍රසම්පාදන

කම්ටු අනුමැතිය ලබා ගෙන දේශන ශාලා පුටු 400 ක් රු. 2,195,200 ක මුදලකට මිල දී ගැනීම සිදු කර ඇත.

රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව වෙත ලබා දී ඇති PFD/PMD/Clari/19 යන ලිපිය ද උක්ත කාර්යය සිදු කිරීමේ දී සැලකිල්ලට ගෙන ඇත. මෙම මිල දී ගැනීමේ දී ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නිතිගත සංස්ථාව විසින් ලංසුගත මිලෙන් 2% ක වට්ටමක් ද ලබා දී ඇත.

ප්‍රසම්පාදන කාර්යය පරිපාටියෙන් බැහැර ව සෘජු කොන්ත්‍රාත් ක්‍රමය අනුගමනය කිරීමේ දී විගණකාධිපති වෙත ඊට හේතු වාර්තා කළ යුතු බැවින් එම ප්‍රසම්පාදන කටයුත්ත පිළිබඳ තොරතුරු NIE/TU/2014/34 සමාංක හා 2014/09/11 දිනැති ලිපිය මඟින් විගණකාධිපති දෙපාර්තමේන්තුව වෙත දැනුම් දී ඇති බව ද කාරුණික ව දන්වා සිටිමි.

දැනට මෙම පුටු 400 ම ගබඩාවෙන් නිකුත් කර ඇත. එක් එක් දෙපාර්තමේන්තුවල තිබූ අවශ්‍යතා අනුව මෙම පුටු භාවිතයට ගෙන ඇත.

## 4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

(අ) ජාතික අධ්‍යාපන ආයතනයේ 2014 වාර්ෂික අයවැය තුළ ලිපිද්‍රව්‍ය සහ මුද්‍රණ කටයුතු වෙනුවෙන් පහත සඳහන් පරිදි ප්‍රතිපාදන වෙන් වී තිබුණි.

| ප්‍රතිපාදන මූලාශ්‍රය | දෙපාර්තමේන්තුව | |
|---|---|---|
| | මුදල් (පොදු භාවිතය සඳහා) (රු.) | මුද්‍රණාලය (රු.) |
| TSEP | 2,000,000 | 6,000,000 |
| ADB | 1,000,000 | 2,200,000 |
| Income | 2,000,000 | 4, 000,000 |

ප්‍රතිපාදන එක් එක් අරමුදල් මූලාශ්‍රවලින් ලැබුණ ද ලිපිද්‍රව්‍ය සඳහා වන වියදම් පොදුවේ වියදම් කිරීම (පොදු කාර්ය පිරිවැයක් බැවින්) ආයතනය තුළ පැවති භාවිතයයි. එම හේතු ව මත අදාළ සහතික පත්‍ර බහාලුම් ලිපි ද්‍රව්‍ය වැය ශීර්ෂය යටතේ මිල දී ගැනීමට කටයුතු කර ඇත. එහෙත් විගණන වාර්තාවේ සඳහන් කරුණු අනුව 2015 වසරේ සිට මෙම තත්ත්වය නිවැරදි කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබේ.

(ආ) අධ්‍යාපන ආංශික සංවර්ධන ව්‍යාපෘති යටතේ (ESDP) 2014 වර්ෂය සඳහා රුපියල් මිලියන 60ක ප්‍රතිපාදන වෙන් ව තිබුණි. මෙම ගනුදෙනුව සිදු වන කාලසීමාව වන විට (ESDP) ප්‍රතිපාදන ඉල්ලීම් කර තිබුණ ද ප්‍රමාණවත් පරිදි අක් මුදල් නොලැබීම නිසා මෙම මිල දී ගැනීම අදාළ වැඩසටහන සඳහා හදිසි අත්‍යවශ්‍ය මිල දී ගැනීමක් වූ බැවින් ESDP ව්‍යාපෘතිය සඳහා අක් මුදල් ලැබූ පසු ගිණුම්ගත කිරීමේ අදහසින් මෙම ගෙවීම TSEP ව්‍යාපෘති මුදල් මඟින් සිදු කරන ලදී. නමුත් ESDP ව්‍යාපෘතිය සඳහා ප්‍රමාණවත්

අක් මුදල් නො ලැබීම හේතුවෙන් මෙම මාරු කිරීම් සටහන යෙදීමට නොහැකි විය. එබැවින් 2014 අයවැය සංශෝධනයේ දී TSEP ව්‍යාපෘතිය යටතේ ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කරන ලදී.

මිල දී ගත් 8GB Pen drive 1000 ගබඩාව වෙතින් මීපේ අධ්‍යාපන නායකත්ව සංවර්ධන මධ්‍යස්ථානය වෙත 2014. 11. 21 දින නිකුත් කර ඇත.

ද්විතීයික පාසල් දහසේ විදුහල්පතිවරුන් පුහුණු කිරීමේ වැඩ සටහන යටතේ පුහුණුවට අදාළ අත් පත්‍රිකා, ඉගෙනුම් ද්‍රව්‍ය, පොත් හා මොඩියුල, වීඩියෝ දර්ශන ආදිය ඇතුළත් කර විදුහල් දහසට ලබාදීම සඳහා උක්ත පෙන් ඩ්‍රයිව් දහසක් ජාතික අධ්‍යාපන ආයතනයේ ගබඩාවෙන් මෙම මධ්‍යස්ථානය වෙත ලබා දී ඇත.

එම පෙන් ඩ්‍රයිවවලට ඇතුළත් කළ යුතු ඉහත ඉගෙනුම් ද්‍රව්‍ය පරිගණක ඇසුරින් පැකේජයක් ලෙස සකස් කර පෙන් ඩ්‍රයිව් දහසට කොපි කළ යුතුව ඇත. ඒ සඳහා අදාළ කාර්යයන් කිරීම සඳහා තාක්ෂණික සහායකයින් හිඟයක් වූ බැවින් එම කාර්යය අවසන් කිරීමට කල්ගත වූ නමුත් මෙම පුහුණු වැඩ සටහන ඉදිරි වර්ෂ දෙකක් පුරා පැවැත්වෙන බැවින් පුහුණු වැඩ සටහන්වල දී සම්පූර්ණ කර නිමවන ලද පෙන් ඩ්‍රයිව් බෙදා දීම සිදු කෙරෙමින් පවතී. පෙන් ඩ්‍රයිව් සඳහා ඇතුළත් කළ යුතු අංග පරිගණක වැඩ සටහනක් ලෙස සකස් කර නිම කළ යුතු අතර මේ සඳහා ප්‍රමාණවත් කාලයක් අවශ්‍ය වූ බැවින් එම කාර්යය දැනට නිම කොට ද්විතීයික පාසල් දහස සඳහා මෙම පෙන් ඩ්‍රයිව් බෙදා හැරීමට සැලසුම් සකස් කොට ඇත.

මෙම පුහුණු වැඩ සටහන් අවසන් වීමට පෙර බෙදාදීම නිම කළ හැකි බව දන්වමි.

## 4.4 අරමුදල් ඌණ උපයෝජනය

2015 වසරේ සිට ඉදිරියට සෑම වර්ෂයකම පර්යේෂණ අරමුදල ප්‍රයෝජනයට ගැනීම සහ පර්යේෂණ වැඩ සටහන් කිරීමට කටයුතු කරනු ලැබේ.

අධ්‍යාපන ක්ෂේත්‍රයේ පර්යේෂණ කිරීම, ආයතනයේ ප්‍රමබ කාර්යයක් ලෙස ආයතනයේ සභාව විසින් හඳුනා ගෙන ඇත.

## 4.5 හඳුනා ගන්නා ලද පාඩු

මුද්‍රණාලයට ලබා දුන් මු/2014/132 දරණ ඇණවුමට අදාළව මුද්‍රණාලය විසින් විභාග දෙපාර්තමේන්තුව වෙත එවන ලද මුල් ආදර්ශකයේ සහතිකය අත්සන් කරනු ලබන නිලධාරින්ගේ තනතුරු, නිල නාම යෙදීමේ දී නැවත සකස් කිරීමක් සිදු කිරීමට වූයේ සහතිකයේ සමබර බව ඇති කිරීමට තිබූ අවශ්‍යතාව මතය.

සහතික නැවත මුද්‍රණය කිරීමේ දී සහතික පත්‍රයේ Director-Examinations යන පදවල Examinatio(n)s යන්නෙහි (n) අකුරෙහි අඩුවක් ඇති බව හඳුනා ගන්නා ලදි. ඒ අනුව එය නිවැරදි කර සහතික ප්‍රමාණය නැවත ලබා දෙන ලෙස මුද්‍රණාලය වෙත දැනුම් දී ඇත.

මුල් අවස්ථාවේ දී ම වැරදි සහගත සහතික පත්‍රයක් දැන දැන ම නිකුත් කිරීමේ බරපතල වූ වරද නිවැරදි කර ගැනීමේ අරමුණින් මෙවැනි පියවරක් ගැනීමට සිදු වී ඇත. එමෙන් ම ජාතික අධ්‍යාපන ආයතනයේ ගෞරවය ආරක්ෂාවීමක් සිදු වී ඇති අතර දෝෂ සහිත ව මුද්‍රණය කර තිබූ සහතික නැවත මුද්‍රණය සඳහා වූ වියදම ආයතනයට දැරීමට සිදු වූ බව ද පිළිගනිමි.

මෙම සහතිකයේ සඳහන් පරිදි උපාධි ප්‍රදානෝත්සවය පැවැත්වීමට නියමිත ව තිබුණේ 2015/01/20 දින වේ. එම දිනය වන විට නව රජයක් පත්වීමත් සමග නව අධ්‍යාපන අමාත්‍යවරයා පත්වීම නිසා උපාධි ප්‍රදානෝත්සවය පවත්වනු ලබන දිනය කල් දැමීමට සිදු විය. ඒ අනුව මුද්‍රණය කළ සහතික පත්‍ර 1450 භාවිතයට ගැනීමට නොහැකි විය.

උපාධි ප්‍රදානෝත්සව දිනය නිවැරදි ව සටහන්වීමකින් තොරව දෝෂ සහිත සහතික පත්‍රයක් නිකුත් කිරීමෙන් ආයතනයේ කීර්තිනාමය රැක ගැනීම උදෙසා උපාධි ප්‍රදානෝත්සවය පැවැත්වීමට තීරණය කරන ලද 2015 මාර්තු 26 යොදා නැවත සහතික මුද්‍රණය කිරීමට සිදු විය.

වසර ගණනාවක සිට ප්‍රතිඵල ප්‍රමාද වී තිබූ විභාග රාශියක ප්‍රතිඵල 2012 වර්ෂයේ සිට කඩිනමින් නිකුත් කිරීමට විශේෂිත වූ වැඩ පිළිවෙළක් යොදා නියමිත දින වකවානු තුළ උපාධි ප්‍රදානෝත්සව පැවැත්වීමට ද කටයුතු කිරීමට හැකි විය.

මෙම තත්ත්වය යටතෙහි විගණන වාර්තාවේ සඳහන් කරුණු පිළිගන්නා අතර මින් ඉදිරියට එවැනි තත්ත්වයක් ඇති නොවීමට වග බලා ගන්නා බව අධ්‍යක්ෂ - විභාග විසින් වාර්තා කර ඇති බව ද කාරුණික ව දන්වා සිටිමි.

## 4.6 කාර්ය මණ්ඩල පරිපාලනය

1. කාර්ය මණ්ඩලය : 2015.06.30 දිනට - අනුමත කාර්ය මණ්ඩලය පහත පරිදි වේ.

| | අනුමත සංඛ්‍යාව | තත්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 108 | 70 | 38 | - |
| තෘතියික මට්ටම | 200 | 108 | 92 | - |
| ද්විතීයික මට්ටම | 223 | 175 | 48 | - |
| ප්‍රාථමික මට්ටම | 121 | 106 | 15 | - |
| වෙනත් (අනියම්/තාවකාලික/කොන්ත්‍රාත් පදනම මත) | - | 16 | - | - |
| එකතුව | **652** | **475** | **193** | - |

ජාතික අධ්‍යාපන ආයතනයේ සංවිධානය ප්‍රතිව්‍යුහගත කිරීමට සහ සේවක සංඛ්‍යා නිර්ණය කිරීමට කටයුතු ආරම්භ කර ඇති අතර, පුරප්පාඩු පිරවීම සඳහා කඩිනමින් ක්‍රියා කරනු ඇත.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 5.1 අයවැය ලේඛනමය පාලනය

පැවති ආයතන සභාවේ සභා කාලය 2014. 12. 31 දිනෙන් අවසන් වූ අතර නව ආයතනයේ සභාවක් පත් කිරීමට 2015 අප්‍රේල් මාසය දක්වා ප්‍රමාද වීම හේතුවෙන් සංශෝධිත අයවැය ලේඛනය ආයතනයේ සභාවේ අනුමැතියට ඉදිරිපත් කිරීමට මැයි මාසය දක්වා කල් ගත විය.

විගණන වාර්තාවේ තත්‍ය වියදම් සහ අයවැයගත වටිනාකම් සමග සැසඳීමේ දී 24% සිට 101% දක්වා විචලනයක් ඇති බවට සඳහන් කරුණු සම්බන්ධව පහත පැහැදිලි කිරීම් ඉදිරිපත් කරමි.

**<u>මෙහෙයුම් ආදායම</u>**

**තැන්පතු හා අභ්‍යන්තර ආදායම**

අයවැයගත වටිනාකම රු. 142,000,000

තත්‍ය වටිනාකම රු. 404,651,628

ආයතනයේ 2014 අයවැය ලේඛනයේ ආදායම් යටතේ වූ අයවැය ප්‍රමාණය සංශෝධිත අයවැය ලේඛනයේ වෙනසක් වී නොමැති අතර එය රු. 142,000,000 කි. එම මුදල සැදී ඇත්තේ පාඨමාලා ගාස්තු, විභාග ගාස්තු හා නේවාසිකාගාර ආදායම්, පෙර පාසල් ආදායම, භාණ්ඩාගාර බිල්පත් පොළී යන අයිතම එකතුවෙනි.

අවසන් ගිණුමේ ආදායම ලෙස පෙන්වා ඇති රු. 404,651,628/- ක මුදල තුළ ඉහත අයවැයගත ආදායම්වලට ඇතුළත් නොවූ තැන්පතු ආදායම්, විකුණුම් ආදායම්, පුස්තකාල ආදායම් හා අනෙකුත් ආදායම්වලින් කොටසක් ද ඇතුළත් වී ඇත.

**<u>පුද්ගල පඩිනඩි හා දීමනා</u>**

**<u>කම්ටු දීමනා</u>**

පිළිගනිමි.

ඉදිරියේ දී මෙවැනි තත්ත්වයක් ඇති නොවන සේ කටයුතු කරනු ලැබේ.

**පාරිතෝෂිත දීමනා**

| | |
|---|---|
| අයවැයගත වටිනාකම | රු. 6,000,000 |
| තත්‍ය වටිනාකම | රු. 11,262,747 |

පාරිතෝෂිත ගෙවීම් සඳහා අයවැය ප්‍රතිපාදනය තීරණය කිරීමේ දී වර්ෂය තුළ සත්‍ය ලෙස ම ගෙවීමට සිදුවන ප්‍රමාණය සඳහා ඇස්තමේන්තු කර ඇති අතර, වර්ෂය තුළ මුදලින් ගෙවා ඇති ප්‍රමාණය රු. 5,610,627/93 කි. වර්ෂය අවසානයේ දී සිදු කළ රු. 9,977,010/08 ක පාරිතෝෂිත දීමනා ප්‍රතිපාදනය (ජර්නල් සටහන් අංක 035) හේතුවෙන් මෙම විචලනය ඇති වී ඇත.

**<u>සැපයුම් හා පාරිභෝගික ද්‍රව්‍ය</u>**

**ලිපිද්‍රව්‍ය**

| | |
|---|---|
| අයවැයගත වටිනාකම | රු. 32,618,000 |
| තත්‍ය වටිනාකම | රු. 24,637,766 |

වර්ෂයේ වියදම ලෙස අවසන් ගිණුම් තුළ සටහන් අංක 29 තුළ අන්තර්ගත රු. 24,637,766 න් (ගිණුම් අංක 127, 188) නිරූපණය වන්නේ උපචිත පදනමට ගිණුම් පිළියෙළ කිරීමේ දී වර්ෂයට අදාළ භාවිත කරන ලද ලිපි ද්‍රව්‍යවල වටිනාකම පමණි. මෙයට අමතරව වර්ෂය තුළ මිල දී ගත් රු. 5,995,861/48 ක ප්‍රමාණයක් අවසන් තොගය තුළ අන්තර්ගත වී ඇත. පාරිභෝජන ද්‍රව්‍ය වටිනාකම වූ රු. 1,413,083/98 ක මුදල ද (සටහන් අංක 29, ගිණුම් අංක 189) ඉහත වියදමට අන්තර්ගත වේ. එවිට වියදම රු. 32,046,711/46 කි. ඒ අනුව විචලනය රු. 571,288/54 කි. ප්‍රතිශතය 1.75% කි.

<u>ඉගැන්නුම් ද්‍රව්‍ය</u>

අයවැයගත වටිනාකම රු. 574,000

තත්‍ය වටිනාකම රු. 167,858

විගණන වාර්තාවේ සඳහන් රු. 167,858 ක තත්‍ය වියදම අවසන් ගිණුම්වල (සටහන් අංක 29. ගිණුම් අංක 0129) සඳහන් වටිනාකම පමණක් වන අතර, එයට අමතරව අවසන් ගිණුමේ සටහන් අංක 32 තුළ වැඩමුළු වියදම් සඳහා වැය වූ ඉගෙනුම් ද්‍රව්‍ය (ගිණුම් අංක 156) යටතේ වූ රු. 402,591 ක වියදමක් දරා ඇත. ඒ අනුව තත්‍ය වියදම රු. 570,449 කි. මේ අනුව විචලනය රු. 3551 කි. ප්‍රතිශතය 0.62% කි.

<u>නඩත්තු</u>

<u>වාහන</u>

කෙටුම්පත් අවසන් ගිණුම් අනුව අයවැය සංශෝධනය සිදුකර ඇත. කෙටුම්පත ගිණුමේ සඳහන් වාහන නඩත්තු වියදම අනුව අයවැය සංශෝධනය කර ඇත. කෙසේ නමුත් අවසන් ගිණුම් වලට අදාළ ජර්නල් සටහන් අනුව මෙම විචලනය ඇති වී ඇත.

**යන්ත්‍රෝපකරණ**

අයවැයගත වටිනාකම රු. 1,700,000

තත්‍ය වටිනාකම රු. 3,420,998

මේ යටතේ ඇති තත්‍ය වියදම් තුළ මූලධන ප්‍රතිපාදන තුළ ඇති පුනරාවර්තන හා වැඩි දියුණු කිරීම්වලට අයත් ප්‍රතිපාදනවලින් කරන ලද වියදම් ද ඇතුළත් වීම තුළින් (වියදම් වර්ගීකරණය තුළ) මෙම තත්ත්වය ඇති වී තිබේ.

<u>ගොඩනැගිලි</u>

අයවැයගත වටිනාකම රු.2,500,000

තත්‍ය වටිනාකම රු.4,381,572

මේ යටතේ ඇති තත්‍ය වියදම් තුළ මූලධන ප්‍රතිපාදන තුළ ඇති පුනරාවර්තන හා වැඩි දියුණු කිරීම්වලට අයත් ප්‍රතිපාදනවලින් කරන ලද වියදම් ද ඇතුළත් වීම තුළින් (වියදම් වර්ගීකරණය තුළ) මෙම තත්ත්වය ඇති වී තිබේ.

**අනෙකුත් ලී බඩු හා කාර්යාල උපකරණ**

අයවැයගත වටිනාකම රු. 5,600,000

තත්‍ය වටිනාකම රු. 7,846,192

මේ යටතේ ඇති තත්‍ය වියදම් තුළ මූලධන ප්‍රතිපාදන තුළ ඇති පුනරාවර්තන හා වැඩි දියුණු කිරීම්වලට අයත් ප්‍රතිපාදනවලින් කරන ලද වියදම් ද ඇතුළත් වීම තුළින් (වියදම් වර්ගීකරණය තුළ) මෙම තත්ත්වය ඇති වී තිබේ.

<u>**ගිවිසුම්ගත සේවා**</u>

<u>**සන්නිවේදනය**</u>

පිළිගනිමි.

කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශනය පදනම් කර ගෙන අයවැය සංශෝධනය සිදු කර ඇත. කෙසේ නමුත් අවසන් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී සිදු කරන ලද ගිණුම් සැසඳුම් හේතුවෙන් මෙම විචලනය පැන නැගී ඇත.

**බැංකු ගාස්තු පොළී හා විගණන ගාස්තු**

| | |
|---|---|
| අයවැයගත වටිනාකම | රු. 1,550,000 |
| තත්‍ය වටිනාකම | රු. 996,240 |

මේ යටතේ තත්‍ය වියදම රු. 996,240/-ක් ලෙස දක්වා ඇත්තේ විගණන ගාස්තු (ගිණුම් අංක 150) යටතේ අවසන් ගිණුමේ දක්වා ඇති මුදල පමණි. සටහන් අංක 35 යටතේ වූ රු. 309,075/54 ක බැංකු ගාස්තු (ගිණුම් අංක 168) සැලකිල්ලට ගත් විට තත්‍ය වියදම රු 1,305,315/54 කි. මේ අනුව විචලනය රු. 244,684/46 කි. එවිට ප්‍රතිශතය 15.8% කි.

## 5.2 නොවිසඳී ඇති විගණන ඡේද

ආයතනයේ සභාවේ ද අනුමැතිය සහිතව වැටුප් සැකසීමේ දී සිදු වී ඇති අඩුපාඩු හා දෝෂ නිවැරදි කිරීම සඳහා කමිටුවක් පත්කර ඇත. ඒ අනුව දැනට කටයුතු කරමින් පවතී.

වැඩිපුර ගෙවූ වැටුප් නිවැරදි ව ගණනය කර ගත් පසු ඒ පිළිබඳව මහා භාණ්ඩාගාරය සමග සාකච්ඡා කර එක් එක් සේවකයාගේ ඉතිරි වී ඇති සේවා කාලයට ගැලපෙන පරිදි ඔවුන්ගේ මාසික වැටුපෙන් වැඩිපුර ගෙවූ වැටුප සඳහා අදාළ අඩු කිරීම් කර ගැනීමට කටයුතු කරනු ලැබේ.

මේ වන විට මෑතක දී විශ්‍රාම ගිය හා ඉවත් වූ සේවකයන්ගේ පාර්තෝෂික දීමනා ගෙවන විට වැඩිපුර ගෙවූ වැටුප අය කර ගැනීම සඳහා අදාළ පාර්තෝෂික දීමනා මුදලින් ගණනය කරන ලද මුදල අඩු කර ගෙන ඉතිරි මුදල ගෙවා ඇත.

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ දී වූ නිර්දේශය අනුව කාර්ය මණ්ඩල වැටුප් වැඩි කර ගැනීම සඳහා මේ වන විට ක්‍රියාමාර්ග ගනිමින් පවතින නිසා එම වැටුප් වැඩි වූ පසු මෙසේ වැඩිපුර ගෙවා ඇති මුදල් පහසුවෙන් අය කර ගත හැකි වනු ඇත.

රු. 156,684/- ක සේවක අර්ථසාධක අරමුදල් වැඩිපුර ගෙවා තිබූ නිලධාරී වෙත මුදල් ආපසු ගෙවන ලෙස ලිපියක් යොමු කර ඇත. එහි පිළිතුරු ලැබුණු පසු ඒ පිළිබඳ අවසන් තත්ත්වය විගණකාධිපති දෙපාර්තමේන්තුව වෙත දැන්වීමට කටයුතු කරනු ලැබේ.

සේවයෙන් ඉවත් වන සේවකයන්ට අවසන් ගෙවීම් සිදු කිරීමේ දී වැඩිපුර ගෙවා තිබූ වැටුප් අඩු කර ගෙන ගෙවීම් සිදු කර ගෙන ඇති බව කාරුණික ව දන්වමි.

## 6. පද්ධති හා පාලනයන්

(අ) සේවක මණ්ඩල කළමනාකරණය

(ආ) අධ්‍යාපන ප්‍රකාශන බෙදාහැරීම

(ඇ) වත්කම් කළමනාකරණය

(ඈ) ගිණුම්කරණය

(ඉ) ප්‍රසම්පාදන ක්‍රියාවලිය

(ඊ) තොග පාලනය

ඉහත (අ) සිට (ඊ) දක්වා කරුණුවලට අනුව මෙම තත්ත්වයන් නිවැරදි කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. ඒ අනුව කටයුතු කරන බව ද කාරුණික ව දන්වා සිටිමි.

මහාචාර්ය ගුණපාල නානායක්කාර
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය

ඇමුණුම 01

මගේ අංකය : ජාඅආ/පාමු/මසේ 3/1/276
පරිපාලන හා මානව සම්පත් දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම.
2015.06.23

24 JUN 2015

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන, මුදල් හා සහාය සේවා) මඟින්
එච්. එන්. සී. ජේ. ෆොන්සේකා මයා
පරිපාලන නිලධාරී
ජාතික අධ්‍යාපන ආයතනය

**කොන්ත්‍රාත් පදනම මත පරිපාලන නිලධාරී තනතුරේ සේවය අවසන් කිරීම**

කොන්ත්‍රාත් පදනම මත පරිපාලන නිලධාරී තනතුර සඳහා ඔබ වෙත නියුක්ත කර ඇති මගේ අංක. ජාඅආ/පාමු/මසේ3/1/235 හා 2013.11.18 දිනැති ලිපිය සහ කොන්ත්‍රාත් පදනම මත සේවය දීර්ඝ කිරීම ශීර්ෂය යටතේ මගේ අංක. ජාඅආ/පාමු/මසේ3/1/276 හා 2014.12.03 දිනැති ලිපිය හා බැඳේ.

අනුමත බඳවා ගැනීමේ පරිපාටිවලට අනුව පරිපාලන නිලධාරී තනතුර සඳහා සුදුසුකම් ඇති නිලධාරියෙකු ස්ථිරව බඳවාගෙන ඇති බැවින් ඔබ වෙත ලබා දී ඇති පරිපාලන නිලධාරී (කොන්ත්‍රාත් පදනම මත) තනතුරෙහි සේවය වහාම ක්‍රියාත්මක වන පරිදි අවසන් කරන බව මෙයින් දන්වමි. ඔබ වෙත නියුක්ත කරන ලද පත්වීම් ලිපියේ කොන්දේසි ප්‍රකාරව 2015 වර්ෂයේ ජූලි මස වැටුප ද ගෙවීමට කටයුතු කරනු ඇත.

ඔබ විසින් දැනටමත් ලබාගෙන ඇති අත්තිකාරම් නිසිපරිදි නිරවුල් කළ යුතු අතර ඔබගේ රාජකාරී හැඳුනුම්පත සහ ඔබ භාරයේ ඇති සියළුම රාජකාරී ලිපි ලේඛණ හා බඩු බාහිරාදිය නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන, මුදල් හා සහාය සේවා) විසින් නම් කරනු ලබන නිලධාරියෙකු වෙත විධිමත් පරිදි භාර දීමට කටයුතු කළ යුතු අතර එහි පිටපතක් මා වෙත එවිය යුතුය.

ඔබගේ සේවා කාලය තුළදී ජාතික අධ්‍යාපන ආයතනයට ඉටු කරන ලද සේවය අගය කොට සලකනු ලබන අතර ඔබට යහපත් අනාගතයක් උදාවේවායි ප්‍රාර්ථනා කරමි.

මහාචාර්ය ගුණපාල නානායක්කාර
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් :
1. නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන, මුදල් හා සහාය සේවා)
2. අධ්‍යක්ෂ (මුදල්) - ආයතනයට ඇති අයවීම් පිළිබඳ (අත්තිකාරම් ඇතුළු) වාර්තා කිරීමට හා පත්වීම් ලිපියේ කොන්දේසි ප්‍රකාරව වැටුප් ගෙවීම සඳහා
3. අධ්‍යක්ෂ (පුස්තකාල හා කෞතුකාගාර) - පොත්පත් භාරදීම පිළිබඳ වාර්තා කිරීමට හා භාර දී නොමැති පොත්වල වටිනාකම් දන්වා එවීමට
4. සහකාර අධ්‍යක්ෂ (පරිපාලන හා මානව සම්පත්) - අවශ්‍ය කටයුතු සඳහා
5. වැඩ බලන අභ්‍යන්තර විගණක
6. මානව සම්පත් නිලධාරී
7. විගණකාධිපති
8. ජාඅආ/පාමු/පාසේ 2 - නිල හැඳුනුම්පත ආපසු ලබා ගැනීමට

ඇමුණුම 02

(A3)

Mi salinas
Income

ජාතික අධ්‍යාපන ආයතනය

NIE R/1

[illegible] PAYING IN VOUCHER

A3 01695

Date: 2013/[illegible]

Receipts Vote: 1 - 7/004/1/01/10 ... IN3

Director General - NIE

Name of Payee or Institution & Address: S.M.M [illegible]

EPF No.

Register No./I.D. No.

If applicable only

Rupees (in words): [illegible]

Cheque/money order No. or details: 067811 [illegible]
2013/11/29

Reason for payment: S.M.M [illegible]

[illegible] advance settlement / Advance No.

[illegible]

(A3)

A3 02111

NIE R/1

# මුදල් භාරදෙන වවුචරය
## பணம் செலுத்தும் படிவம்/PAYING IN VOUCHER

දිනය / திகதி /Date: 2015/10/09

IN3

Receipts Vote: 1 1 / 2001 / 0710

Director General - NIE

Name of Payee or Institute & Address: S. M. M [illegible]

[illegible]

EPF No.

Register No/I.D No.

If applicable only

Rupees (In words): [illegible]

Cheque/money order No. or details: 411172 25/09/2015 [illegible]

Reason for payment? S. M. M [illegible]

[illegible]

If on advance settlement Advance No.

Voucher No.

Rs. 14603/93

cents

Depositor's Signature

Office use only

Received the above amount

Date: 2015/10/09

Cashier

Receipts No. 47222

අමුණුම - 03

# ජාතික අධ්‍යාපන ආයතනය
# தேசிய கல்வி நிறுவகம்
# NATIONAL INSTITUTE OF EDUCATION

තැ.පෙ. 21, හයිලෙවල් පාර, මහරගම
த.பெ. 21, ஹைலெவல் வீதி, மகரகம
P.O. Box 21, High Level Road, Maharagama, Sri Lanka

අපේ යොමුව: / எமது கோவை: / *Our Reference:* ජාඅආ/පාමු/පිසේ1/6/230

ඔබේ යොමුව: / உங்கள் கோவை: / *Your Reference:*

දිනය: / திகதி: / *Date:* 2015.08.04

එම්. ජේ. පී. දේශප්‍රිය මහතා
ප්‍රධාන ව්‍යාපෘති නිලධාරී,
අංක. 73/I,
පන්සල පාර,
මහරගම.

04 AUG 2015
345

ප්‍රිය මහත්මයාණෙනි,

**<u>නැවත සේවයේ පිහිටුවීම</u>**

ඔබ විසින් ජාතික අධ්‍යාපන ආයතනයට එරෙහිව පවරා ඇති අංක MH33/1179/2014 දරන නඩුව 2015.05.15 දින විභාගයට ගත් අවස්ථාවේ දී ඔබ විසින් ඉදිරිපත් කරන ලද සමථ යෝජනාව ආයතන සභාව වෙත යොමු කිරීමෙන් පසු 2015.07.13 දින රැස්වූ 398 වන ආයතන සභා රැස්වීම් වාරයේ දී ඔබ නැවත සේවයේ පිහිටුවීමට තීරණය කරන ලදී.

